# ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිබඳ සරල මාර්ගෝපදේශය




පාර්ලිමේන්තු කාන්තා සංසදයේ සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ
සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවේ ප්‍රකාශනයක්

2021

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිබඳ සරල මාර්ගෝපදේශය

**ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව (ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාව)**

2021



# පටුන


- පාර්ලිමේන්තු කාන්තා සංසදයේ සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවේ සභාපතිනියගේ පණිවිඩය - ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය - ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය 5
- පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී කුෂානි රෝහණධීර මහත්මියගේ පණිවිඩය 7
- පෙරවදන 9
- පළමු ඒකකය: අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය යනු කුමක්ද? 11
- දෙවන ඒකකය : අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting – IGRPB) ලංකාවට වැදගත් වන්නේ ඇයි? 14
- තුන්වන ඒකකය: සැලසුම්කරණය" අයවැය චක්‍රය සහ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය 18
- හතරවන ඒකකය: ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය තුළින් තිරසාර සංවර්ධන සැලැස්මේ අභිමතාර්ථ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම 25
- පස්වන ඒකකය: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව සහ ප්‍රතිපාදන 32
- ඇමුණුම I : ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය තත්ත්වය පිළිබඳ සංඛ්‍යානමය දළ විශ්ලේෂණය 33
- ඇමුණුම II : ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී අයවැය කෙරෙහි අවධානය යොමු කළ යුතු කරුණු (2022 අයවැය යෝජනා කැඳවීමට අදාළ කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 01/2021 චක්‍ර ලේඛය ඇමිණීම) 40
- ඇමුණුම III : රට හදන සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුවේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය විශ්ලේෂණය 54





**පාර්ලිමේන්තු කාන්තා සංසදයේ සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවේ සභාපතිනියගේ පණිවිඩය**

## ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

**ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය**

අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිබඳ සරල මාර්ගෝපදේශය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මගේ සෙසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. මෙම මාර්ගෝපදේශය කාන්තා පාර්ලිමේන්තු සංසදයේ සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවේ ප්‍රකාශනයකි. මෙම මාර්ගෝපදේශය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ජාතික අයවැය විවාදයේ සක්‍රියව සම්බන්ධ වීමට සහ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් යෝජනා කිරීමට තොරතුරු සහ ප්‍රායෝගික මෙවලම් සපයයි.

තේරීම් කාරක සභාවේ සාමාජිකයින් ලෙස අපි ජාතික අයවැයවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය විදහා නොදැක්වීම අභියෝග කිරීමට සහ අයවැය සාධාරණ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී බව සහතික කිරීමට කැපවී සිටිමු.

අයවැය ක්‍රියාවලිය 2021 මැද භාගයේදී ආරම්භ වූ විට, කමිටුව මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද සැලසුම්කරණ සහ අයවැය යෝජනාවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය ඇතුලත් කිරීමේ වැදගත්කම ඉස්මතු කිරීමට විවිධ රේඛීය අමාත්‍යාංශ පොකුරු වශයෙන් හමුවිය. 2017 අයවැය කැඳවීමේදී ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12ක් හඳුන්වාදීම ඇතුළුව රජය විසින් ප්‍රශංසනීය මුලපිරීම් පසුගිය කාලය තුළ සිදු කර ඇත. රජයේ නියෝජිතයන් සමඟ පැවති අපගේ පසුගිය සාකච්ඡාවලදී, වැටහුණේ එම හඳුන්වා දුන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සඳහා ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් නොතිබුණ බවය. මෙම අත්පොත සකස් කිරීමේදී ඉහත සඳහන් කළ අත්දැකීම් සහ උපදේශන උපයෝගී කරගෙන ඇත.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් චක්‍ර ලේඛයක් නිකුත් කර ඇත. එම චක්‍ර ලේඛය, සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන බව සහතික කිරීම, කාන්තා ආර්ථික සවිබල ගැන්වීම් සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිශ්චිත ක්ෂේත්‍ර අටක් 2022 අයවැය කැඳවීමට ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවේ අධීක්ෂණ කාර්යයට අනුකූලව 2022 අයවැයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී බව නිරීක්ෂණය කිරීම සඳහා එම තේරීම් කාරක සභාව කාන්තා රාජ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

ජාතික අයවැය ක්‍රියාවලියේදී අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයක් ඇතුලත් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපට තීරණාත්මක කාර්යභාරයක් ඇත. එබැවින්, අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ

අයවැයකරණය පිළිබඳ සංකල්ප සහ මෙවලම් පිළිබඳව තාක්ෂණිකව හුරුවීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට මෙම මාර්ගෝපදේශය ඉමහත් සහයෝගයක් වනු ඇතැයි මම විශ්වාස කරමි. ජාතික අයවැය විවාදයන්වලට අර්ථවත් ලෙස සම්බන්ධ වීමට මෙම මාර්ගෝපදේශය භාවිතා කරන ලෙස මම මගේ සහෝදර මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමි.

මෙම මාර්ගෝපදේශය සකස් කිරීමට සම්බන්ධ වූ විශේෂඥයින්ට සහ මගේ සෙසු කමිටු සාමාජිකයින්ට ස්තූති කිරීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි. කාරක සභාවට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය නොලැබෙන්නට මෙතරම් කෙටි කාලයක් තුළ මෙම මාර්ගෝපදේශය සකස් කිරීම කළ නොහැකි වනු ඇත.





**පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී**

## කුෂාණි රෝහණධීර මහත්මියගේ

**පණිවිඩය**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට භාවිතා කිරීම සඳහා අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිබඳ සරල මාර්ගෝපදේශය සකස් කිරීමට මෙම කාලෝචිත මුලපිරීම සිදුකළ කාන්තා පාර්ලිමේන්තු සංසදය සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ඔවුන්ගේ අධීක්ෂණ සහ නියෝජිත භූමිකාවට සාධාරණත්වයක් ඉටු කරමින්, අත්‍යාවශ්‍ය ප්‍රතිපත්ති හඳුන්වාදීම හරහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඉහළ නැංවීමට කමිටුව සෑම විටම ක්‍රියාශීලීව කටයුතු කරයි. අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය සම්බන්ධ මූලික සංකල්ප සහ මෙවලම් අවබෝධ කර ගැනීම සඳහා මෙම මාර්ගෝපදේශය සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඉතා ප්‍රයෝජනවත් වන බව මට විශ්වාසයි. එවිට ඔවුන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමානාත්මතාවය අගයන ජාතික අයවැයක් ලඟාකර ගැනීම සඳහා අර්ථවත් ලෙස දායක විය හැකිය.

මෙම මාර්ගෝපදේශය අයවැය ක්‍රියාවලියේ තීරණාත්මක මොහොතකදී එළි දැක්වෙන අතර ජාතික අයවැය විවාදය ස්ත්‍රී පුරුෂ සමාජභාවයට වඩාත් සංවේදී සහ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) ප්‍රතිඵල කරා යොමු කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම සපයනු ඇත. විවාදය වාර්ෂිකව වසරේ අවසාන මාස දෙක තුළ පැවැත්වීමට නියමිතය.

කෝවිඩ් 19 නිසා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, කාන්තාවන්ට ඔවුන්ගේ විවිධ භූමිකාවන් හේතුවෙන් නම්‍යශීලී රැකියාවක් සොයා ගැනීම මෙන්ම එම රැකියාවල තිබෙන අවිනිශ්චිතභාවය, රැකවරණය සැපයීමේදී අන්තර්ජාලය ඔස්සේ තම අධ්‍යාපන කටයුතු වල නිරත වන බැවින් එයට කාලය ගතවීම සහ අනෙකුත් අභියෝග නිසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු උග්‍ර වන බවත් ඒ තුළින් අහිතකර සෞඛ්‍ය අවදානමක් ගෙන කටයුතු කිරීම මෙහි ප්‍රතිඵලය වේ. එබැවින්, රටේ ජනගහනයෙන් 52% ක් වන කාන්තාවන් ඇතුළු සමාජයේ ආන්තික කොටස්වලට ඇති බර අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ බල අසමතුලිතතාවයන් ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වේ. ජාතික අයවැය මෙම අසමමිතිය විසඳිය හැකි ප්‍රධාන ආකාරයකි.

මෙම මාර්ගෝපදේශය ජාතික අයවැය විවාදයේදී සහ අයවැය චක්‍රය ඔස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට භාවිතා කළ හැකි අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණයේ මූලික කරුණු ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙනුවෙන් මෙම කාලෝචිත ප්‍රකාශනය සඳහා කාන්තා පාර්ලිමේන්තු සංසදයට සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවට ද මම සුභ පැතීමට කැමැත්තෙමි. ඉදිරියේදීත් පාර්ලිමේන්තු ලේකම් කාර්යාලය මෙවැනි අර්ථාන්විත වැඩකටයුතු සඳහා අඛණ්ඩව සහයෝගය ලබාදෙන බවට මෙයින් ප්‍රතිඥා දෙමි.



## පෙරවදන

අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) සම්බන්ධ සරල මාර්ගෝපදේශය කාන්තා පාර්ලිමේන්තු සංසදයේ සහ ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ (ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාව) සංකල්පයක් වන අතර එමඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සම්පත් අත්පොතක් සඳහා අපේක්ෂා කරන ලද අවශ්‍යතාවය සපුරාලනු ඇත.

මෙම මාර්ගෝපදේශයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) සම්බන්ධව ඇති සංකල්ප පැහැදිලි කිරීම, ශ්‍රී ලංකාව තුළ එහි ඇති වැදගත්කම සහ අවශ්‍යතාව පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර දැනුවත් සංවාදයක් විවෘත කර දීමයි, මෙම මාර්ගෝපදේශය තුළ සැලසුම්කරණය සහ අයවැය සැකසීම පිළිබඳ සියළුම නිශ්චිත තාක්ෂණික තොරතුරු ඇතුළත් නොවන නමුත් සාමාන්‍ය දැනුම සහ මූලික අවබෝධය සඳහා අවම දේ ඉදිරිපත් කෙරේ. වඩාත් පැහැදිලි හා සවිස්තරාත්මක තොරතුරු සඳහා, ඉදිරියේදී ප්‍රකාශයට පත්වීමට නියමිත "ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අත්පොත" වෙත යොමු විය හැකිය.

පටුනේ සඳහන් කර ඇති පරිදි මෙම මාර්ගෝපදේශයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) සම්බන්ධ සංකල්ප කිහිපයක් පිළිබඳ තොරතුරු පැහැදිලි කිරීම සහ ශ්‍රී ලංකාව තුළ එහි ඇති වැදගත්කම මෙන්ම අයවැය චක්‍රයේ විවිධ අවධිවලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධ වීමේ අවශ්‍යතාව පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර දැනුවත් සංවාදයක් විවෘත කර දීමයි, ජාතික ප්‍රතිපත්ති රාමුවලට අනුකූලව සංවර්ධන සැලසුම් සහ අයවැය කෙරෙහි බලපෑම් කිරීමේදී සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේම භූමිකාව මෙම මාර්ගෝපදේශය තුළින් ප්‍රවර්ධනය කෙරේ. තිරසාර සංවර්ධන සැලැස්මේ පස්වන ඉලක්කය සහ අනෙකුත් අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දර්ශක කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය ද අවධාරණය කෙරේ.

මෙම මාර්ගෝපදේශය මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට සහ ඔවුන්ගේ අදහස් වලට විවෘත වන විට ක්‍රියාශීලීව හා දැනුවත් ලෙස සාකච්ඡා හා විවාද වලට සහභාගී වීම සඳහා සූදානම් වීමට හැකි වේ. පාර්ලිමේන්තු කතිකාවන්හි අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට සහ ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එවැනි වේදිකා භාවිතා කිරීම ඉතාමත් වැදගත් වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය පිළිබඳ විශේෂඥ ශ්‍රියානි පෙරේරා මහත්මිය මෙම මාර්ගෝපදේශය රචනා කර ඇති අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ලිමේන්තු කාන්තා සංසදය සහ ස්ත්‍රී පුරුෂ සමතාව සහ සමානාත්මතාවය පිළිබඳ තේරීම් කාරක සභාවට අවශ්‍ය තාක්ෂණික දැනුම ඇය මෙමඟින් ලබා දී ඇත. පාර්ලිමේන්තු කාන්තා සංසදය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජීය ඇතුළත්භාවය පිළිබඳ ක්‍රියාධරයින් (GESI) සහ අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර තාක්ෂණික දැනුම ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම ප්‍රායෝගික මෙවලම සකස් කර ඇත, ශ්‍යාමා සල්ගාදු මහත්මිය මෙම මාර්ගෝපදේශය සකස් කිරීමෙහිලා ඇගේ සහයෝගය සැලකිය යුතු අයුරින් ලබා දුන් අතර අවසාන කෙටුම්පතද සංස්කරණය කරන ලදී.



# පළමු ඒකකය: අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය යනු කුමක්ද?

රජයකට ලබා ගත හැකි වැදගත්ම ප්‍රතිපත්ති මෙවලම් අතර අයවැය ද වේ. එක් අතකින් එය රටක සමස්ත ආදායම් හා වියදම් මට්ටමට බලපෑම් කරන අතර අනෙක් පැත්තෙන් එහි දේශපාලන ප්‍රමුඛතා පිළිබිඹු කරයි. අයවැය වෙන් කිරීම් ස්ත්‍රී පුරුෂ භාවයෙන් තොර බව පෙනුනද, ප්‍රත්‍යක්ෂ මූලික සොයා ගැනීම් වලින් පෙන්නුම් කෙරෙන්නේ, රජය ආදායම ඉහළ නංවන ආකාරය පුරුෂයින්ට හා පිරිමි ළමයින්ට සාපේක්ෂව කාන්තාවන් සහ ගැහැණු ළමයින් කෙරෙහි වෙනස් බලපෑමක් ඇති කරන බවත්, බොහෝ විට එය කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට අවාසිදායක බවත් ය. මෙයට හේතුව සමාජය තුළ කාන්තාව හා පිරිමියා විසින් ඉටු කරන සමාජමය භූමිකාවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ශ්‍රමය බෙදීම, විවිධ වගකීම් සහ හැකියාවන් සහ කාන්තාවන් සහ පිරිමින් මුහුණ දෙන විවිධ බාධක, අඩු ආර්ථික, සමාජීය හා දේශපාලන බලය යන සියල්ල නිසා සාමාන්‍යයෙන් කාන්තාවන් පිරිමින්ට වඩා පීඩිත තත්ත්වයකට පත්වීමයි.

ශ්‍රී ලංකා රජයේ අයවැය යනු අමාත්‍යාංශ, ආයතන සහ රජයට අයත් ව්‍යාපෘති සඳහා සම්පත් වෙන් කිරීම සහ මාස 12 ක කාලයක් තුළ සියලු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තීරණය කරන වැදගත් කළමනාකරණ මෙවලමකි.[i] ජාතික අයවැය සැකසීම, ඒ සම්බන්ධ රාජ්‍ය වියදම් කළමනාකරණය, අධීක්ෂණය කිරීම සහ රේඛීය අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ එලදායී සම්බන්ධීකරණයක් මඟින් අයවැයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය වේ.[ii] ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ මුදල් කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරනු ලබන පළාත් අයවැය ද තිබේ. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 සඳහා සහ පළාත් පාලන ආයතන 341 සඳහා ද වෙනම අයවැයක් ඇත.

**අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (**Inclusive and Gender Responsive Planning and Budgeting**) යනු කුමක්ද?**

අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සමාජ මානයන්, ශ්‍රී ලංකා රජයෙහි සැලසුම්කරණය හා අයවැය ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීමේ මෙවලමකි. අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) මඟින්, ගතානුගතික අයවැයකරණය මඟින් මඟ හැරෙන සමාජීය හා ආර්ථික ප්‍රශ්න සහ ප්‍රතිපත්තිමය හිදැස් හඳුනාගෙන, එම දුර්වලතා මඟහරවා ගැනීමට අවස්ථාව ලැබේ. එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීතාවයෙන් යුතු භාණ්ඩ හා සේවා සැපයීම කල හැක. එමෙන්ම රටේ පවත්නා සන්දර්භය සලකා බලා වයස, ආගමික හෝ ජනවාර්ගික වෙනස්කම්, පදිංචි ස්ථානය (නාගරික/ග්‍රාමීය/ භූගෝලීය පිහිටීම) වැනි අසමානතාවයන් ගැනද අවධානය යොමු කල හැක.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අයවැය ක්‍රියාවලියේ සමස්ත සන්දර්භය තුළ පැහැදිලි ක්‍රියාවලීන් සහ විශ්ලේෂණාත්මක මෙවලම් තුළින් ස්ත්‍රී පුරුෂ දෘෂ්ඨි කෝණයක් ඒකාබද්ධ කිරීම ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය, ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) අර්ථ දක්වයි. එම අයවැය සකස් කිරීම අදියර තුනකින් සමන්විත වේ: ආ) ගැටලු විශ්ලේෂණය, ආ) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අය වැය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඇ) මුළු අයවැය ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ක්‍රමානුකූලව කාවැද්දීම.[iii]

සාරාංශයක් වශයෙන්, අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting) යනු විවිධ සැලසුම්කරණ පියවරවලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්ව සහ සමානාත්මතා දෘෂ්ටිකෝණයන් ඇතුළත් කරන ක්‍රියාවලියකි - ඉලක්ක කණ්ඩායම් අවශ්‍යතා තක්සේරු කිරීම/ප්‍රතිපත්ති/ සැලසුම්කරණය/වැඩ සටහන් සැකසීම, සම්පත් වෙන් කිරීම, අයවැය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම සහ සම්පත් නැවත ප්‍රතිනිර්මාණය කිරීම වැනි විවිධ පියවර වේ.

**අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive) යනු කුමක්ද?**

| | |
|---|---|
| **අන්තර්ග්‍රහණීය** | (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) (Inclusiveness) : යන්නෙන් අදහස් කරන්නේ සමාජය සහ සංවර්ධනය වන ආර්ථිකය තුළ සහභාගී වීමේදී, එහි තුළ ඇති කොන්දේසි සහ තත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලි මඟින් විශේෂයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා අවස්ථා වැඩිදියුණු කිරීම, සම්පත් බෙදා හැරීම, ඔවුන්ගේ හඬ, ගෞරවය සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම යන ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමයි. |
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවය** | (Gender): ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු කිසියම් සංස්කෘතියක/ස්ථානයක පුරුෂයින්ට හා කාන්තාවන්ට පැවරී ඇති සමාජයීය වශයෙන් ගොඩනඟන ලද භූමිකාවන්, වගකීම් සහ තත්ත්වයන් සහ ඒවාට අනුබල දෙන සමාජ ව්‍යුහයන් ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු සංස්කෘතීන් අතර සහ කාලය තුළ වෙනස් වන සදාකාලික නොවන හැසිරීමකි. |
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී** | (Gender responsiveness) යනු ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා ඒ සඳහා අවශ්‍ය පියවරවල්, සංවර්ධන වැඩ සටහන් වලට ඇතුළත් කිරීම මෙන්ම සැලසුම් සහ අයවැය තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය සහ සමානාත්මතාවයට බලපාන හිදැස් හා ගැටලු විසඳීමට ක්‍රියාකාරී ලෙස දායක වීමයි. |
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය** | (Gender equity) යනු කාන්තාවන්ට සහ පිරිමින්ට සහ වෙනත් අනන්‍යතාවන්ට සාධාරණ වීමේ ක්‍රියාවලියයි. සාධාරණත්වය සහතික කිරීම සඳහා කාන්තාවන්ට සහ පිරිමින්ට සම මට්ටමේ අවස්ථා ලබා දිය යුතු වෙයි. එමෙන්ම කාන්තාවන්ට සිදු වූ ඓතිහාසික, සමාජීය හා ආර්ථික අවාසි මඟහරවා ගැනීමට සාධාරණත්වය, උපාය මාර්ග සහ අවශ්‍ය වැඩපිළිවෙලවල් තිබිය යුතුය. සාධාරණත්වය සමානාත්මතාවයට මඟ පාදයි. |
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව** | (Gender Equality) යනු සංඛ්‍යාව, තත්වය සහ වටිනාකම අනුව කාන්තාවන් සහ පිරිමින් අතර ඇති සමානතාවයයි. අධ්‍යාපනය, රැකියාව, සෞඛ්‍ය, දේශපාලන සහභාගීත්වය, ආරක්ෂාව සහ යුක්තිය සඳහා ඇති ප්‍රවේශය මැයින් ගත් කල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව මූලික මානව අයිතිවාසිකමකි. සමානාත්මතාව දිගු කාලීන අයිතිවාසිකම් පදනම් කරගත් සංවර්ධන ඉලක්කයක් විය යුතුය. සාධාරණත්වය ඒ දෙසට ගමන් කිරීමේ උපාය මාර්ගයක් විය හැකිය. |

එම නිසා සැලසුම් සකස් කිරීමේදී හා සම්පත් වෙන් කිරීමේදී සියලු ජන කණ්ඩායම්, කාන්තාවන් සහ පිරිමින් සඳහා ඇති අවස්ථා, සහභාගීත්වයේ සහ ප්‍රතිලාභවල හිදැස් ගැන සලකා බලා එම හිදැස් අඩු කිරීමට පියවර ගැනීම වැදගත් වේ. සැමට සමාන ප්‍රතිලාභ ස්ථිර කරමින් සැමවිටම සමානාත්මතා පියවර ගැනීමට සහ සියලුම ජන කණ්ඩායම්/ කාන්තාවන්ට සහ පිරිමින්ට එක හා සමානව සැලකීම එකවර ඉක්මනින් කල නොහැකි විය හැකිය. දශක ගණනාවක සමාජ ආර්ථික හා සංස්කෘතික වෙනස්කම්, භූගෝලීය වශයෙන් හුදකලා වීම, ජනවාර්ගික හා වෙනත් සමාජ අසාධාරණකම් හේතුවෙන් වෙනස්කම් සිදු වී ඇති අතර, එම වෙනස්කම් අත්විඳින කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සත්‍යාර්ථ ක්‍රියාමාර්ග (Affirmative action) තුළින් අසාධාරණයන් නිවැරදි කළ යුතු වේ. එවැනි සත්‍යාර්ථ ක්‍රියාමාර්ග මඟින් දිගු කාලීන සමානාත්මතාවය සඳහා පසුබිම සකස් කරන මට්ටමේ වටපිටාවක් නිර්මාණය කළ හැකිය.

එක් හොඳ උදාහරණයක් නම් අධ්‍යාපන අංශයයි. අතීතයේ අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමේදී සහ ලංකාවේ සමාන අධ්‍යාපන ප්‍රතිපත්තියේ ප්‍රතිලාභ භුක්ති විඳීමේදී ගැහැණු ළමයින් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. ගැහැණු ළමයින් පාසලෙන් ඉවත් වීමට සමාජීය අවබෝධය, සංස්කෘතික හා සාම්ප්‍රදායික බාධක, පීතෘ මූලික ආකල්ප සහ පිරිමි දරුවන්ගේ අවශ්‍යතාවන් මුල් කර ගැනීම යන සියල්ල හේතු විය. කෙසේ වෙතත්, බලයට පත් වූ රජයන් ගත් සත්‍යාර්ථ ක්‍රියාමාර්ග (Affirmative action) මඟින් ගැහැණු ළමයින්ට නිදහස් අධ්‍යාපනය, නොමිලේ පෙළ පොත් සහ නිල ඇඳුම් ආදිය ලබා ගැනීමට හැකි වූ අතර ගැහැණු ළමයින්ට අධ්‍යාපනය ලබාදීම කෙරෙහි ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීමේදී මාධ්‍ය විශාල දායකත්වයක් ලබා දුන්නේය. එවැනි සාධාරණත්වය උදෙසා තැබූ පියවරයන් හේතුවෙන් 2019 වර්ෂයේදී ලංකාවේ තෘතීයික අධ්‍යාපනයේ ගැහැණු ළමයින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළට පැමිණීමට හැකි වූ අතර, තෘතීයික අධ්‍යාපනය සඳහා ඇතුළත් වූ සෑම පිරිමි ළමයෙකුටම 1.38 ගැහැණු ළමුන්ගේ අනුපාතයක් වාර්තා කරයි.

'කාන්තා අයවැය' හෝ 'ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය' යනු කාන්තාවන් සඳහා හෝ පිරිමින් සඳහා වූ වෙනම අයවැයක් නොවන බව හඳුනා ගැනීම ද වැදගත් ය. එවැනි අයවැයක් මඟින් බලාපොරොත්තු වනුයේ රජයේ මූලික අයවැය සහ එහි දිගුකාලීන ප්‍රතිඵල කාන්තා සහ පිරිමි කණ්ඩායම්වලට කෙසේ බලපාන්නේද යන්න ස්ත්‍රී පුරුෂ සමාජවාදීව වෙන් කොට සලකා බැලීම සහ ස්ත්‍රී පුරුෂ සමාජ සම්බන්ධතාවන් කෙරෙහි එම අයවැයේ බලපෑම අවධානාත්මකව සොයා බැලීමයි. එමඟින් රාජ්‍ය ප්‍රතිපත්ති හා අයවැය වෙන් කිරීම විවිධ කණ්ඩායම්වලට බලපාන ආකාරය විශ්ලේෂණය කෙරේ.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය වනුයේ:**

- කාන්තාවන් සඳහා වෙනම අයවැයක් නොවේ;
- කාන්තාවන් සහ පිරිමින් සඳහා එකම ප්‍රමාණයක් වැය කිරීම ගැන නොවේ;
- විශේෂයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් ඉලක්ක කරගත් වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම ගැන පමණක් නොවේ.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අයවැය ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කිරීම පමණක් නොවේ.
- කාන්තාවන් සඳහා වන ප්‍රතිපාදන වැඩි කිරීම පමණක් නොවේ. නව යෝජනා ක්‍රම සහ වැඩ සටහන්ද හඳුන්වා දීම තුළින් ස්ත්‍රී පුරුෂ සම සාධාරණත්වය සාක්ෂාත් කිරීමකි.
- කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වගකීම පමණක් නොවේ.

## දෙවන ඒකකය : අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය (Inclusive and Gender Responsive Planning and Budgeting – IGRPB) ලංකාවට වැදගත් වන්නේ ඇයි?

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිබඳ කතිකාව වර්ධනය වූයේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා හිදැස පුළුල් හෝ පටු කිරීමට හැකි බවට ඇති අවබෝධයක් තුළින් ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවයේ ආර්ථික පිරිවැය කාන්තාවන්ට පමණක් නොව සමස්ත සමාජයටම දැරීමට වීම මෙම අවබෝධයට හේතු විය (එල්සන් 2002).[iv] ආර්ථික ඉලක්ක සහ සමාජ කැපවීම් අතර වැඩි ස්ථාවරත්වයක් සහතික කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය තුළින් හැකි වන බවට තර්ක කෙරේ. (හෙවිට් සහ මුඛෝපාධ්‍යා 2002)[v].

අයවැය රජයේ වැදගත් ප්‍රතිපත්තිමය මෙවලම වේ. ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකළහොත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවන අතර රජයේ ප්‍රතිපත්ති සමඟ අයවැය සම්බන්ධ වන ආකාරය මෙයින් පෙනේ. ඕනෑම සන්දර්භයක් තුළ පරිවර්තනීය වෙනස්කම් ඇති කිරීමට රජයේ අයවැය ප්‍රබල මාධ්‍යයකි.[vi] එබැවින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී අයවැය පරිවර්තනීය වෙනස්කම් ඇති කිරීමට සහ කාන්තාවන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කළ හැකි උපාය මාර්ගයකි.

අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය ශ්‍රී ලංකාවට වැදගත් වීමට පහත සඳහන් ප්‍රධාන කරුණු හේතු වේ:

අ. ශ්‍රී ලංකාව වැනි බහු වාර්ගික හා බහු ආගමික රටක් සිය ජනතාවට සේවය කිරීම සඳහා සාධාරණ හා සමාන ප්‍රවේශයක් ලෙස සිය සැලසුම් අයවැයට ඇතුළත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

ආ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේය යන්නයි.

ඇ. සැලසුම් කිරීම අවශ්‍ය කරන කලාපීය හා දිස්ත්‍රික් විෂමතාවන් පිළිබඳ එක් හොඳ උදාහරණයක් නම් දරිද්‍රතා තත්ත්වයයි. 2016 දී ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මූලික දර්ශකය 4.1% ක් වූ අතර එය අංශය අනුව වෙනස් වේ: නාගරික 1.9%, ග්‍රාමීය 4.3% සහ වතු අංශය 8.8%. 2016 දී දරිද්‍රතා දර්ශකයේ පිරිමින්ගේ 4.1% අගයට සාපේක්ෂව කාන්තාවන්ගේ අගය 3.9% ක් විය. දුප්පතුන් ජනගහනයෙන් 4.1% ක් පමණක් වුවද, අවදානමට ලක්විය හැකි ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් දරිද්‍රතා රේඛාවට මදක් ඉහළින් සිටින අතර, කොවිඩ් -19 තත්ත්වය ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු දරිද්‍රතා රේඛාවෙන් පහළට ඇද දමා ඇති බව නිසැකය.

ඈ. ශ්‍රී ලංකාවේ දරිද්‍රතා සංඛ්‍යාලේඛන පෙන්වා දෙන්නේ දිළිඳුකම ඉහළ මට්ටමක පවතින බව සහ පවුල් දරිද්‍රතා දර්ශක ඉහළ මට්ටමක පවතින දිස්ත්‍රික්ක ඇති බවයි. 2016 වර්ෂයේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, වඩා ඉහළම මට්ටමේ දිළිඳු දර්ශකය (8.8%) වතු අංශය වාර්තා වූ අතර නාගරික (1.9%) සහ ග්‍රාමීය (4.3%) ක්ද වේ. දිස්ත්‍රික්ක වශයෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කය ඉහළම දරිද්‍රතා දර්ශකය (18.2%) මුලතිව් (12.7%) මඩකලපුව (11.3%) ත්‍රිකුණාමලය (10.0%) යාපනය (7.7%) කෑගල්ල (7.1%) බදුල්ල (6.8%) රත්නපුර (6.5%) නුවරඑළිය (6.3%) මොණරාගල (5.8%) ලෙස වාර්තා කරයි. මහනුවර (5.5%) ක් වන අතර කොළඹ වාර්තා (0.9%) කි.

ඉ. 2019 දී ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ප්‍රතිශතය 51.58% ක් වන අතර ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී සැලැස්මක් සහ අයවැය සකස් කිරීමක් අවශ්‍ය වේ. කාන්තාවන්ගේ අධ්‍යාපන හැකියාවන් පිරිමින්ට සාපේක්ෂව ඉහළ මට්ටමකින් තිබෙන නමුත් ඔවුන් ගණන් ගනු ලබන්නේ ශ්‍රම බලකායෙන් 35% ක් පමණක් වන අතර ඔවුන් වැඩි වශයෙන් අවිධිමත් අංශයට ශ්‍රමයෙන් දායක වේ.

ඊ. පාර්ලිමේන්තුවේ කාන්තාවන් 5.4% ක් වන අතර නිශ්චිත කාන්තා ප්‍රතිශතයක් (quota system) හේතුවෙන් පළාත් පාලන ආයතන වල කලින් (2014) පැවති 1.9% ට වඩා කාන්තා මන්ත්‍රීවරුන් 2018 වන විට 10.9% දක්වා වැඩි විය.

එ. ශ්‍රී ලංකාවේ සහකරුවෙක් ඇති කාන්තාවන් අතරින්: ශාරීරික හිංසනය 18.9%, ලිංගික හිංසනය 6.8%, මානසික හිංසනය 27.9% සහ ආර්ථික හිංසනය 18.1% අත් විඳී. මෙබැවින් ස්ත්‍රී පුරුෂ භේදය පැහැදිලිව පෙනෙන අතර මෙම අසමමිතිය නිවැරදි කිරීම සඳහා සත්‍යාර්ථ ක්‍රියාමාර්ග (Affirmative action) අවශ්‍ය වේ.

**මූලික තර්කය නම්**

- ආර්ථිකය තුළ ඔවුන් ඉටු කරන, විවිධ සමාජය විසින් ලබාදී ඇති භූමිකාවන් නිසා අයවැය කාන්තාවන්ට සහ පිරිමින්ට වෙනස් ලෙස බලපායි.
- විශේෂ පියවර නොගතහොත් කාන්තාවන්ට පිරිමින්ට වඩා රජයේ සැලසුම් සහ අයවැයෙන් ලැබෙන ප්‍රතිලාභ අඩු ය.
- රජය සත්‍යාර්ථ ක්‍රියා නොගතහොත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කාන්තාවන්ට සිදුවන නොසලකා හැරීම් ශක්තිමත් වීමට හෝ වැඩි වීමට පවා ඉඩ ඇත.
- අයවැය වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඇති අන්ධභාවය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘතිකරණයන් සහ පක්ෂපාතීභාවයන් සම්ප්‍රේෂණය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා උපකාරී වේ.

**අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය තුළින් කරනු ලැබෙන්නේ**

1. රජයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක, සංවර්ධන සැලසුම් තුළින් සාක්ෂාත් කරගන්නේද සහ එම ප්‍රතිපත්ති වල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්ව අරමුණු සාක්‍ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කරන්නේද යන්න නිරීක්ෂණය කිරීමට අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය හොඳ ක්‍රමයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අරමුණු මඟින් එක් එක් ආංශික ප්‍රතිපත්ති වල අවශ්‍යතා හඳුනාගනු ලබන අතර කාන්තාවන්ගේ හා පිරිමින්ගේ මනාපයන් හා අවශ්‍යතා සහ එම ප්‍රතිපත්ති ඔවුන්ට වෙනස් ලෙස ප්‍රතිලාභ ලබන ආකාරය හඳුනා ගනී.

2. තිරසාර සංවර්ධන ඉලක්ක වල සාර්ථකත්වය අධීක්ෂණය කිරීම සඳහා අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය හොඳ මෙවලමක් වන අතර නිශ්චිතවම තිරසාර සංවර්ධන සැලැස්මේ පස්වන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සහ අනෙක් ඉලක්කවල හරස් දර්ශක 80 ද ඒ හා සබැඳි අනිකුත් ඉලක්ක 14 ද ජය ගත හැක.

3. දිළිඳුකම පිටුදැකීම ඵලදායි, සාධාරණ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය  සමානාත්මතාවයෙන් සිදු වන බවට සහතික වීම සඳහා අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය සාර්ථක ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය ස්ත්‍රී මූලික කරගෙන පවතින අතර, ආදායම් දරිද්‍රතාවයේ නිශ්චිත ලක්‍ෂණ පවුල් වලින් 25% කටත් වඩා වැඩි සංඛ්‍යාවක් කාන්තා මූලික පවුල් බව සාමාන්‍යයෙන් දන්නා කරුණකි.

4. අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය, ජාතික අයවැය තුල ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රතිපාදන වෙන් කිරීම් ප්‍රවර්ධනය කරන අතර එමඟින් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් හරි අඩකටත් වඩා වැඩි කාන්තාවන්ගේ ඵලදායිතාව ඉහළ යනු ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවය අඩුවීම සහ ඉහළ වර්ධන වේගය අතර ධනාත්මක සහ සම්බන්ධයක් ඇති බව අධ්‍යයන කිහිපයක්ම පෙන්වා දී ඇත. කාන්තාවන්ට තොරතුරු සඳහා ඇති ප්‍රවේශය, ණය, ව්‍යාප්ති සේවා, යෙදවුම් සහ වෙළෙඳපොළ සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය වැඩි කළ හොත් සහ ඔවුන්ගේ කාලය ඉතිරි වුවහොත්, (උදාහරණයක් ලෙස ශ්‍රමය ඉතිරි කිරීමේ යටිතල පහසුකම් සඳහා වන ආයෝජනය) කාන්තාවන්ගේ ඵලදායිතාව අසමාන ලෙස වැඩි වේ.

5. අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය මඟින් ජාත්‍යන්තර සම්මුති සඳහා රජයේ කැපවීම සාක්ෂාත් කරගැනීමට දායක වේ. (1995 බීජිංහි පැවති  සිව්වන කාන්තා ලෝක සමුළුව වැනි සමුළුවලදී සහ ජාතික ප්‍රතිපත්ති ලේඛන වලින් ස්ථාපිත කැපවීම්) විශේෂයෙන් කාන්තාවන්ට එරෙහි සියළු ආකාරවල වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියේ (CEDAW) ඇති කාන්තා අයිතීන් සාක්ෂාත් කර ගැනීමට ප්‍රමාණවත් සම්පත් ප්‍රතිපාදන වෙන් කිරීමද ඇතුළත් වේ.

6. අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය යහපත් හා විනිවිදභාවයක් සහතික කිරීම සඳහා වූ එක් ක්‍රමයකි. ජාතික අයවැය ක්‍රියාවලියේදී අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පුරවැසියන්ට වැඩි වැඩියෙන් වගවීම සහ ඔවුන්ගේ ලිංගික අනන්‍යතාවය, ජනවාර්ගිකත්වය, කුලය සහ සමාජ තරාතිරම නොබලා සැමටම සංවර්ධන ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා දෙන ලෙස ඉල්ලා සිටී. සාධාරණ හා වගකීමෙන් යුතුව කාන්තාවන්ට, පිරිමින්ට, ගැහැණු සහ පිරිමි ළමයින්ට භාණ්ඩ හා සේවා සැපයීම වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලිය 'යහපාලනය' යන වචනය ප්‍රායෝගික කිරීමේ අනිවාර්ය අංගයක් ලෙස සැලකිය යුතුය.

7. සංවර්ධන සැලසුම්, අයවැය අධීක්‍ෂණය කිරීමේදී සහ කාර්ය සාධනය වාර්තා කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය පිළිබඳ වෙන් කළ දත්ත සඳහා මූලික වේ. ඒ සම්බන්ධ දත්ත පවත්වා ගැනීම පිළිබඳ නවතම කැබිනට් චක්‍ර ලේඛනය මෙම අවශ්‍යතාවන්ට අනුකූල වේ.

8. මෙබදු සංවේදී අයවැයකින් අයවැය වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන අතර එමඟින් වැඩිපුරම මූල්‍ය අවශ්‍යතා උවමනා අයට ප්‍රතිලාභ ලැබෙන බව සහතික කෙරේ.

9. අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය යනු මිනිසුන් අතර පවතින නොගැළපීම් නිසා ඇති වන බැහැර කිරීම් විශ්ලේෂණය කිරීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වෙනස්කොට සැලකීම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු විශ්ලේෂණය කිරීම සහ සාධාරණ උපාය මාර්ග පදනම් කරගෙන ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වීමට සිවිල් සමාජයට අවකාශයක් නිර්මාණය කළ හැකි ප්‍රවේශයකි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට සහාය වන සිවිල් සමාජය විසින් සැලසුම් සහ වියදම් ක්‍රියාත්මක කිරීමේ වගවීම සහ විනිවිදභාවය නිරීක්ෂණය කිරීමේ මෙවලම් ද අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ සංවේදී අයවැයහි ඇතුළත් ය. සිවිල් සමාජය විසින්  සිදු කරන එවැනි අධීක්ෂණයන් මඟින් වෙනස්කොට සැලකීම්, අකාර්යක්ෂමතාව සහ දූෂණ වලට අභියෝග කිරීම සඳහා ප්‍රශ්න මතු කිරීමට සහ තොරතුරු උත්පාදනය කිරීමට හැකිය.

10. කාන්තාවන් සමජාතීය කණ්ඩායමක් නොවන බවත් පවුල්වල ප්‍රධානීන්, වැන්දඹුවන්, වතු කාන්තාවන්, ආබාධිත කාන්තාවන්, ගැටුම් වලින් පීඩාවට පත් කාන්තාවන්, කර්මාන්ත ශාලා සේවිකාවන්, ක්ෂුද්‍ර ව්‍යවසාය තුළ සිටින කාන්තාවන් සහ ව්‍යාපාරික කාන්තාවන් වැනි විවිධ අයට විවිධ අවශ්‍යතා පවතින බවත් අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය පිළිගනී.

11. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට විශේෂිත වූ ගැටලු විසඳීමට සහ කාන්තාවන්ගේ හා අනෙකුත් අවදානම් සහිත කණ්ඩායම්වල ගෞරවය සහ ආරක්ෂාව තහවුරු කිරීම මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමට උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සහතික කිරීමට හා ඒවාට පිළියම් යෙදීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහතික කිරීමට රජය දරන උත්සාහයන් ඉස්මතු කර දැක්වීමට ද අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය හොඳ මෙවලමකි.

# තුන්වන ඒකකය: සැලසුම්කරණය, අයවැය චක්‍රය සහ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය

ඕනෑම රටක සැලසුම් හා අයවැය චක්‍රය අදියර හතරකින් සමන්විත වන අතර අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය යනු අදියර හතරටම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පැතිකඩයන් ඇතුළත් කිරීමේ ප්‍රවේශයකි.

**රූපය 1: අය වැය චක්‍රය**




**පළමුවන අදියර : අයවැය සකස් කිරීම**

අයවැය සකස් කිරීම ජාතික හා ඉන් පහළ මට්ටමින් සමන්විත දීර්ඝ හා සවිස්තරාත්මක වාර්ෂික සැලසුම් ක්‍රියාවලිය සමඟ අන්තර් සම්බන්ධිතයි. මෙම ක්‍රියාවලිය මෙහෙයවනු ලබන්නේ රජයේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය මගිනි. උපායමාර්ගික සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව සකස් කර ඇත්තේ මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව, ප්‍රතිපත්ති විශේෂඥයින් සහ අනෙකුත් ප්‍රධාන ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදන ආයතන විසින් සිදු කරන සාමූහික ව්‍යායාමයක් මගිනි. සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය රජයේ දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති රාමුව හා සෘජුව සම්බන්ධ වේ.

චක්‍රීය අයවැය ක්‍රියාවලිය සාමාන්‍යයෙන් ආරම්භ වන්නේ මැයි - ජුනි මාසවල භාණ්ඩාගාරය විසින් කැබිනට් පත්‍රිකාවක් සකස් කිරීමත් සමඟ අයවැය සැකසීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා කැබිනට් අනුමැතිය ඉල්ලා සිටීමෙනි. කැබිනට් මණ්ඩලය මෙම ඉල්ලීම අනුමත කර මුදල් අමාත්‍යාංශයට අධිකාරිය ලබා දීමෙන් පසු ඊළඟ පියවර වන්නේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අයවැය යෝජනා කැඳවීම සකස් කිරීමයි. අයවැය යෝජනා කැඳවීම සකස් කිරීම වැදගත් ලේඛනයක් වන අතර එමඟින් ඉදිරි අයවැය සැකැස්මට අවශ්‍ය මඟ පෙන්වීම සහ සාර්ව ආර්ථික රාමුව, අවධානය යොමු කළ යුතු ක්ෂෙත්‍ර, සීමාවන් සහ අදාළ වර්ෂයේ අයවැය සඳහා භාවිතා කළ යුතු ආකෘති සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ. අයවැය යෝජනා කැඳවීම සියලුම අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන වෙත දැනුම් දීමට පෙර, එය මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කළ යුතුය. අයවැය යෝජනා කැඳවීම සෑම රේඛීය අමාත්‍යාංශයක්ම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක්ම සහ මුදල් කොමිසම වැනි අනෙකුත් ප්‍රධාන ආයතන වෙත යවනු ලැබේ. ජාතික අයවැය යෝජනා කැඳවීම මත පදනම්ව පළාත් සභා සඳහා අයවැය යෝජනා කැඳවීම මුදල් කොමිසම විසින් සකස් කරනු ඇත. අයවැය යෝජනා කැඳවීම පිළිබඳව රේඛීය අමාත්‍යාංශ සැලසුම් ඒකක දැනුවත් කර ඇති අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සහ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ වල අභ්‍යන්තර රැස්වීම් පැවැත්වේ. අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන අයවැය සකස් කිරීමේදී එම ආයතන මගින් ලබා දීමට සැලසුම්කරණ සේවාවන්ට ප්‍රමුඛත්වය දෙති.

සාමාන්‍යයෙන් මෙම අයවැය යෝජනා කැඳවීමට පෙර රේඛීය අමාත්‍යාංශ සැලසුම් ක්‍රියාවලියන් ආරම්භ කරන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වා පහළට දිව යන රේඛීය අමාත්‍යාංශ ව්‍යුහයක් ඊට ඇතුළත් වේ. අවශ්‍යතා තක්සේරු කිරීම් විවිධ මට්ටම් වලින් සිදු කෙරේ - රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපත්ති වලට අනුකූලව ගම්, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් මෙය සිදු කෙරේ. සැලසුම් කිරීමේ හා අයවැය සකස් කිරීමේ කාල සීමාව තුළදී රේඛීය අමාත්‍යාංශ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී උපදෙස් ලබා ගනී. සාමාන්‍යයෙන් රේඛීය අමාත්‍යාංශවලට ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මාසයක කෙටි කාලයක් තිබේ. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ආකෘති භාවිතා කරයි. ඇස්තමේන්තු ලැබීමෙන් පසු, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව එක් එක් රේඛීය අමාත්‍යාංශ සමඟ රැස්වීම් පවත්වා ඇස්තමේන්තු පිළිබඳව සාකච්ඡා කරයි. මුදල් කොමිෂන් සභාව සියළුම පළාත් අයවැය එකතු කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යවයි. රැස්වීම් මාලාවකට පසු, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සියළුම රේඛීය අමාත්‍යාංශ සහ පළාත් අයවැය ඇස්තමේන්තු උපයෝගී කර ගෙන නියමිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට වන ජාතික අයවැය කෙටුම්පත සකස් කරයි.

## දෙවන අදියරඃ අයවැය අනුමැතිය /බලාත්මක කිරීම

ජාතික අයවැය සහ පළාත් අයවැය සඳහා අයවැය අනුමැතිය /බලාත්මක කිරීම පාර්ලිමේන්තුවේ වගකීමකි. ඓතිහාසිකව, ජාතික අයවැය අනුමත කිරීම සිදු වන්නේ නොවැම්බර් මාසයේදීය. ඒ ජාතික පාර්ලිමේන්තුවට අයවැය ලේඛනය සාකච්ඡාව, වාද විවාද, ඡන්ද විමසීම සහ සම්මත කර ගැනීම සඳහා විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙනි. විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී දෙවරක් කියවේ. පළමු වරට කියවන විට එක් එක් රේඛීය අමාත්‍යාංශ සඳහා අයවැය වෙන් කිරීම සිදු කෙරෙන අතර දෙවන වර කියවීමේදී සවිස්තරාත්මක තක්සේරුවක් ඉදිරිපත් කර විවාදයට ගැනේ. ඇස්තමේන්තු පිළිබඳ විස්තර සකස් කිරීමෙන් පසු අයවැය මහජන සමාලෝචනය සඳහා විවෘත කෙරේ. මුදල් ඇමතිවරයාගේ අයවැය කතාව පාර්ලිමේන්තුවේදී පැවැත්වීමෙන් පසු අයවැය විවාදය ආරම්භ වේ. අයවැය විවාද කිරීම සාමාන්‍යයෙන් මාසයක් හෝ අවම වශයෙන් දින 22 ක් වැනි දිගු ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය සඳහා මාධ්‍ය පුළුල් ප්‍රචාරයක් ලබා දෙන හෙයින් අයවැය කතාව සහ ඉන් පසුව කෙරෙන වාද විවාද ගැන මහජනයා දැන ගනී. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව තුළ සහ පාර්ලිමේන්තුවෙන් පිටත අයවැය පිළිබඳව ප්‍රවීණයන් හා විද්වතුන් විසින් දේශපාලන විවාද පවතී. මෙම විවාද ක්‍රියාවලිය අවසානයේදී, අයවැය පාර්ලිමේන්තුවෙන් අනුමත කරන අතර සාමාන්‍යයෙන් ඡන්ද විමසීමක් සිදු වන්නේ මේ අවස්ථාවේදී ය. එය අනුමත වූ පසු කථානායකතුමා විසින් සෑම අයවැය මාතෘකාවක් යටතේම ඔහුගේ අත්සන ඇතිව අනුමැතිය සටහන් කරනු ලැබේ. එය සම්පූර්ණ වූ පසු, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි චක්‍රලේඛ නිකුත් කරමින් රේඛීය අමාත්‍යාංශ සඳහා වියදම් ලබා දීම සිදු කරයි.

විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කළ හොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරිය යුතුය. ඕනෑම රජයක් සඳහා අයවැය චක්‍රයේ මෙම අදියර කෙතරම් වැදගත් ද යන්න මෙයින් පෙනේ.

## තුන්වන අදියරඃ අයවැය ක්‍රියාත්මක කිරීම

අයවැය ක්‍රියාත්මක කිරීම යනු අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන තම මුදල් වියදම් කරන ආකාරය පිළිබඳව මඟ පෙන්වන මෙවලම බවට අයවැය පත්වන අවධියයි. අයවැය ක්‍රියාත්මක කිරීම යනු අයවැය මඟින් ශ්‍රී ලංකාවේ ජනතාවට අත්‍යවශ්‍ය සේවාවන් ලබා දෙන අවධිය වේ. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව රේඛීය අමාත්‍යාංශ විසින් භාණ්ඩාගාරයෙන් ජනවාරි මස පළමු කාර්තුවේ අයවැය, ආංශික අමාත්‍යාංශ සඳහා නිකුත් කරන ලෙස ඉල්ලා සිටින අතර එය සෑම කාර්තුවකම අඛණ්ඩව සිදුවේ. සැලසුම් වල වියදම් සහ ප්‍රගතිය පිළිබඳව රේඛීය අමාත්‍යාංශ විසින් සෑම කාර්තුවකම භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු අතර සාමාන්‍යයෙන් අයවැය අධීක්ෂණය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වගකීම අයවැය අධීක්ෂණ අංශය සතු වේ. ජාතික අයවැය දෙපාර්තමේන්තුව ජාතික අයවැය වියදම පිළිබඳ කාර්තුමය වාර්තා සකස් කරයි. මෙම කාල පරිච්ඡේදයේදීම, එනම් පළමු කාර්තුවේදී, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර සඳහා වූ වාර්ෂික අයවැය සමාලෝචන වාර්තාව සකස් කර එය ප්‍රකාශයට පත් කරනු ඇත. පළාත්, දිස්ත්‍රික්ක සහ කොට්ඨාශයන්හි පිහිටි රේඛීය අමාත්‍යාංශ

කාර්යාලවලට අදාළ පළාත් පාලන ව්‍යුහයන් හරහා මුදල් වෙන් කරන ලෙස රේඛීය අමාත්‍යාංශ විසින් භාණ්ඩාගාරයට ද දැනුම් දෙනු ඇත. ජාතික නොවන මට්ටමින් ඇති මේ සෑම රේඛීය අමාත්‍යාංශ කාර්යාලයක්ම අදාළ පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රගති වාර්තා හා කාර්තුමය වියදම් ප්‍රකාශයන් අදාළ රේඛීය අමාත්‍යාංශ සැලසුම් හා අධීක්ෂණ අංශයටද පිටපතක් ඇතිව ලබා දෙනු ඇත. මුදල් කොමිසම විසින් පළාත් සභා ප්‍රගති වාර්තා අධීක්ෂණය කරනු ඇත.

### හතරවන අදියර: ඇගයීම සහ විගණනය

ඇගයීම සහ විගණනය අනුව ජාතික අයවැය කුමන ආකාරයෙන් වැයවීද යන්න තීරණය වේ. මෙම අදියරේදී රජය නීත්‍යානුකූලව මුදල් වැය කරන්නේද සහ අනුමත අයවැය අනුව අරමුදල් වැය කරන්නේද යන්න දැන ගැනීමට අවශ්‍යය. වාර්ෂික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අයවැය සමාලෝචනය, ජාතික අයවැය පිළිබඳ කාරක සභාව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ. කිසියම් විෂමතාවයක් ඇත්නම් ඒ අනුව ඒ පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශයට සහ විගණකාධිපතිවරයා වෙත දැනුම් දෙනු ඇත. පසුගිය වසරේ අයවැය විගණනය ඉදිරි වසරේ ජනවාරි මාසයේදී සිදු කෙරේ.

**අයවැය චක්‍රයේ සෑම අදියරකදීම අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය ඇති කිරීම අත්‍යවශ්‍ය වන අතර එක් එක් අදියර සඳහා පහසුවෙන් භාවිතා කල හැකි මෙවලම් ගණනාවක් තිබේ.**

බංග්ලාදේශය (ඉන්දියාවේ, බංග්ලාදේශයේ සහ රුවන්ඩාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය : අදිති රතෝගේ සංසන්දනයන් - ඔබ්සර්වර් පර්යේෂණ පදනම (Observer Research Foundation - ORF සටහන් අංක 260, ජූලි 2020 යන්නෙන් උපුටා ගන්නා ලදී)

**ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය ප්‍රකාශ: බංග්ලාදේශයෙහි තීව්‍රත්වය, ක්‍රියාකාරීත්වය සහ ආකෘති**

වාර්ෂික අයවැය සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය පිළිබඳ විශ්ලේෂණයක් බංග්ලාදේශ මුදල් ඇමති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විට 2009-10 දී සුවිශේෂී සහ වෙනම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයක් හඳුන්වා දෙනු ලැබීය. අධ්‍යාපනය, සෞඛ්‍ය සහ පවුල් සුභසාධනය, සමාජ සුභසාධනය සහ ආපදා කළමනාකරණය යන අමාත්‍යාංශ හතරක් පමණක් පළමු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය වාර්තාවෙන් ආවරණය විය. 2011-12 දී සියළුම අමාත්‍යාංශ සහ කොට්ඨාශයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය (GRB) ක්‍රියාවලියට යටත් කරන ලදී. එතැන් සිට සෑම වසරකම රජය විසින් කාන්තාවන්ගේ ප්‍රගතිය සඳහා වූ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග, කාන්තා සංවර්ධනයට අදාළ විවිධ අමාත්‍යාංශ හා කොට්ඨාශ සහ මෙම කටයුතු සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන පැහැදිලි කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය.

සෑම අමාත්‍යාංශයකටම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය වාර්තාවක් ඇති අතර එය මුදල් අමාත්‍යාංශයේ අයවැය ලේඛන යටතේ පෙන්නුම් කෙරේ. මෙම වාර්තාවල අමාත්‍යාංශයේ අදාළ ප්‍රතිපත්ති, කාන්තා ප්‍රගතිය පිළිබඳ අමාත්‍යාංශ විශේෂිත ජාතික ප්‍රතිපත්ති නියෝග සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ඉලක්ක සහ දර්ශක පිළිබඳ සවිස්තර කොටස් ඇත. ගිණුම්කරණ ක්‍රියාවලියක් ලෙස අදාළ ප්‍රතිපත්ති සහ අයවැය ප්‍රතිපාදන සරලව හඳුනා ගැනීමට අමතරව, අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් වල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතරය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති බාධාවන් ද වාර්තාවලින් හඳුනා ගැනේ. තවද, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා දර්ශක සකස් කරන සමාජ-දේශපාලන සවිබල ගැන්වීමේ දර්ශක තක්සේරු කිරීම සඳහා වැදගත් වන "අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සඳහා කාන්තා සහභාගීත්වය සහ මුළු වියදමෙන් ඔවුන්ගේ කොටස" පිළිබඳ ඒකාබද්ධ දත්ත සපයනු ලැබේ. මෙයින් පෙනෙන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී තීරණ ගැනීමේ ක්‍රියාවලියට කාන්තාවන්ගේ සහභාගිත්වය, දේශපාලන තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියට කාන්තා සහභාගීත්වය ලබා දෙන බවට නීති සැපයීම සහ පළාත් පාලන තනතුරු වලින් තුනෙන් එකක් කාන්තාවන් සඳහා වෙන් කිරීම වැනි දේ සඳහා බංග්ලාදේශය අවශ්‍ය දත්ත සැපයීමට කටයුතු කර ඇති බවයි.

2019-20 සඳහා බංග්ලාදේශයේ මුදල් ඇමති යෝජනා කළේ "රටේ කාන්තාවන්ගේ දියුණුව" සඳහා ජාතික අයවැයෙන් සියයට 30.82 ක මුදලක් වෙන් කිරීමට සහ කාන්තා ව්‍යවසායකයින් සඳහා ප්‍රදර්ශනාගාර කුලී සඳහා එකතු කළ අගය මත බදු (Value Added Tax) නිදහස් කිරීම් සඳහා ය. මේවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වැඩසටහන් සඳහා මුදල් ලබා දීමේදී සහ බදු අය කිරීම කාන්තාවන්ට බලපාන ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීමේ වැදගත් උත්සාහයන් වන අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය (GRB) ක්‍රියාත්මක කිරීම අයවැය තුළ කාන්තාවන්ට අවකාශය ලබාදීම හෝ කාන්තා වැඩ සටහන් සඳහා අරමුදල් වැඩි කිරීම පමණක් නොවේ.

කෙසේ වෙතත්, මෙම අධ්‍යයනයේදී තවදුරටත් සඳහන් වන්නේ "බංග්ලාදේශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැය (GRB) ක්‍රියාත්මක කිරීමේ එක් ප්‍රධාන ගැටලුවක් නම් ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය දත්ත වෙන්කිරීම් නොමැති වීම සහ සමස්ත මධ්‍ය කාලීන අයවැය රාමුව ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය පුරාම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ බලපෑමයි. රාජ්‍ය මූල්‍යය විනිවිදභාවය පිළිබඳ තීරණාත්මක අංගයක් වන මෙම දර්ශක, නියාමන අවශ්‍යතාවයක් බවට පත් කළ යුතුය".

*බංග්ලාදේශ අත්දැකීමෙන් පාඩම් ඉගෙන ගෙන ඇස්තමේන්තුගත ජාතික අයවැය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විශ්ලේෂණයක් හඳුන්වා දී ඇස්තමේන්තු සමඟ එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වැදගත් ය. එවැනි විශ්ලේෂණයන් මගින් සාරවත් අයවැය විවාදයන් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා රජයේ කැපවීම ප්‍රශ්න කිරීමට/ හෝ රජයේ වගවීම විදහා දැක්වීමට හැකි වේ.*

**සැලසුම් සහ අයවැය චක්‍රයට බලපෑම් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් විය හැකි අවස්ථාවන්**

**අයවැය සකස් කිරීම**

1. කාන්තා පාර්ලිමේන්තු සංසදයට සහ කාන්තා අයිතීන් පිළිබඳ තේරීම් කාරක සභා සාමාජිකත්වයට, අන්තර්ග්‍රහණීය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් මතුවන හිදැස් හඳුනාගැනීම, ගැටළු විශ්ලේෂණය යන ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම හා යොමුවීම කල හැක. එම විශ්ලේෂණ අයවැයකරණ ක්‍රියාවලියට යොමු කල යුතුය.

2. සැබෑ තත්ත්වය පිළිබඳ තොරතුරු/විශ්ලේෂණ උත්පාදනය කිරීම සහ උපායමාර්ගික මැදිහත්වීම් වලට ප්‍රමුඛතාවය දීම සඳහා මිනිසුන් අතර පවතින නොගැළපීම් නිසා ඇති වන බැහැර කිරීම් සහ අසමානතාවයන් පිළිබඳ කරුණු විශ්ලේෂණය කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිවිල් සමාජය සමඟ සම්බන්ධ විය හැකිය.

3. අයුක්තියට හේතු වී ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පවතින වෙනස්කොට සැළකීම් සහ මිනිසුන් අතර පවතින නොගැළපීම් නිසා ඇති වන බැහැර කිරීම් ආංශික ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විශ්ලේෂණ කිරීම්/තක්සේරු කිරීම් සහ වාර්ෂික සැලැස්ම සැකසීමේදී එම දත්ත භාවිතා කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අදාළ අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කළ හැකිය.

4. පාර්ලිමේන්තු මන්ත්‍රීන් සහ මන්ත්‍රීනියන් හට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය/කාන්තාවන් පිළිබඳ තේරීම් කාරක සභාව සහ පාර්ලිමේන්තු කාන්තා සංසදය හා සම්බන්ධ වී ජාතික ප්‍රතිපත්ති රාමුවේ අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බැඳීම් පිළිබඳ සංවාදය සහ සාකච්ඡාව තුළින් සාර්ව ආර්ථික ප්‍රතිපත්තියට බලපෑම් කළ හැකිය.

5. ජාතික සැලැස්ම හා අයවැය ක්‍රියාවලියේ ප්‍රධාන මාර්ගෝපදේශන ලේඛනයක් වන අයවැය යෝජනා කැඳවීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රකාශයක් හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඇමුණුමක් එකතු කිරීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බලපෑම් කළ හැකිය. (කරුණාකර කාන්තා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කරන ලද 2022 ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ චක්‍ර ලේඛනය සඳහා ඇමුණුම II බලන්න)

6. ප්‍රධාන වැඩ සටහන්/ක්‍රියාකාරකම්/ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී ආංශික ප්‍රතිපත්ති වල ස්ත්‍රී පුරුෂ සමාජභාවී අරමුණු පිළිපැදිය යුතු යැයි අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය තනතුරු දරන සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම අදාළ අමාත්‍යාංශයට උපදෙස් දිය හැකිය.

7. අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය තනතුරු දරන සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුම අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණයට අදාළ චක්‍ර ලේඛනයට අනුකූලව කටයුතු කරන ලෙස අදාළ අමාත්‍යාංශ සැලසුම් අංශයට යොමු කළ හැකිය.

8. තිරසාර සංවර්ධන ඉලක්ක වල පස්වන ඉලක්කය වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සහ එහි අනෙකුත් ඉලක්ක 14 හා සබැඳි අනිකුත් දර්ශකද සාක්ෂාත් කර ගැනීමට සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඒවා ප්‍රවර්ධනය කළ හැකිය.

9. පසුගිය වසරේ අයවැය ලේඛනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බලපෑම්වල තක්සේරුවක් කැඳවා සැලසුම් හා වෙන් කිරීම් වල ඇති හිදැස් හඳුනා ගැනීම.

| | |
|---|---|
| **අයවැය අනුමැතිය/ බලාත්මක කිරීම** | 1. විසර්ජන පනත් කෙටුම්පත සහ අදාළ ඇස්තමේන්තු අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී කෝණයකින් අධ්‍යයනය කිරීම සහ අංශ අනුව ඇස්තමේන්තු වල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වාර්තාවක් සකස් කිරීම.<br>2. අයවැය විවාදයට සක්‍රියව සහභාගී වීම සහ විවිධ අමාත්‍යාංශ අයවැය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඒකාබද්ධතාවය/ වෙනස්කම්, හිදැස් ආදිය ඉස්මතු කිරීම.<br>3. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවයන් සහ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය, සම්පත් අසමාන ලෙස බෙදා හැරීම, ව්‍යාපාර වලදී කාන්තාව කෙරෙහි අවධානය යොමු නොවීම, අසමාන ලෙස බල බෙදා හැරීම වැනි ගැටලු විසඳා ගැනීමේ කැපී පෙනෙන හිදැස් පෙන්වා දීම.<br>4. කාන්තාවන්ගේ ප්‍රතිලාභ සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කළ හැකි අංශ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සඳහා සහාය දීම, සහ අසමානතාවන් දුරු කිරීමට උපදෙස් දීම.<br>5. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පරිවර්තනීය සංවර්ධනයක් සිදු කිරීමට අවශ්‍ය හොඳම ව්‍යාපෘති ඉස්මතු කිරීම.<br>6. විසර්ජන පනත් කෙටුම්පත අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී කෝණයකින් බැලීම සඳහා සිවිල් සමාජය හා පර්යේෂකයන් අයවැය විවාදයට සම්බන්ධ කිරීමට දිරිමත් කිරීම. |
| **අයවැය ක්‍රියාත්මක කිරීම** | 1. වාර්ෂික සැලසුම් සහ අයවැය කිසිදු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කොට සැලකීම්, අක්‍රමිකතාවයකින් /දූෂණ වලින් තොරව ආංශික අමාත්‍යාංශ වලට ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බලපෑම් කළ හැකිය.<br>2. විනිවිදභාවය සහ වගවීම ජනතාව වෙනුවෙන් පවත්වා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ආයතන/අමාත්‍යාංශ සහ ජාතික මට්ටමේ නොවන ව්‍යුහයන් වලට දිරිමත් කිරීම.<br>3. සැලසුම් හා අයවැය ක්‍රියාත්මක කිරීමේ කාර්තුමය ප්‍රගති වාර්තාවල අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණයෙහි ප්‍රගතිය වාර්තා කිරීමට වෙනම උප වාර්තාවක් තිබීමට උපදෙස් දීම.<br>4. සියළුම ආයතන විසින් ලිංගිකත්වය පිළිබඳ වෙන් කළ දත්ත පවත්වාගෙන යන බවට සහතික වීම<br>5. සැලැස්ම, අයවැය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා ජනතාවගේ සහභාගීත්වය දිරිමත් කිරීම. |
| **ඇගයීම සහ විගණනය** | 1. ජාතික අයවැය, බාහිර සංවිධානවල තාක්ෂණික දායකත්වයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විගණනය/ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බලපෑම් තක්සේරුවක් පැවැත්වීම සඳහා කැඳවීම් කර ප්‍රතිඵල සමඟ පාර්ලිමේන්තුව දැනුවත් කිරීම.<br>2. ඊළඟ අයවැය යෝජනා කැඳවීමේදී තක්සේරු වාර්තාවේ සොයා ගැනීම් ඇතුළත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වීම. |

**කැනඩාවේ කාන්තාවන්ගේ තත්ත්වය - කැනේඩියානු පාර්ලිමේන්තුවේ ස්ථාවර කමිටුව 2009 දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය (GRB) ඇතුළු ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහළ නැංවීම සඳහා මෙම නිර්දේශ ලබා දුන්නේය.**

ස්ථාවර කමිටුවේ වාර්තාවෙන් උපුටා ගත් කොටස්: 40 වැනි පාර්ලිමේන්තුව: 2 වන සැසිවාරය.

**නිර්දේශය 25**

2009 දෙසැම්බර් වන විට කැනඩා රජය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ කොමසාරිස් කාර්යාලය පිහිටුවා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා කොමසාරිස්වරයෙකු පත් කරන ලෙස කමිටුව නිර්දේශ කරයි; රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ ආකෘතිය මත පදනම්ව මෙම කොමසාරිස්වරයාද පාර්ලිමේන්තු නිලධාරියෙකු ලෙස පත් කළ යුතු බව සහ ඔහුගේ හෝ ඇයගේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස්වරයාට අවශ්‍ය සියලු සම්පත් ලබා දෙන ලෙසටද කමිටුව නිර්දේශ කරයි.

**නිර්දේශය 26**

කමිටුව නිර්දේශ කරන්නේ කැනඩා රජය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා වගවීමේ යාන්ත්‍රණයන් පිළිබඳ විශේෂඥ මණ්ඩලයේ වැඩ කටයුතු පදනම් කරගනිමින්, 2009 අප්‍රේල් වන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු බවයි. මෙම නීතිය මඟින් ෆෙඩරල් දෙපාර්තමේන්තු හා ඒජන්සි වල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය විශ්ලේෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැය පිළිබඳ වගකීම් දක්වා ඇති බවත්; මෙම නීතිය මඟින් රාජ්‍ය භාෂා කොමසාරිස් කාර්යාලයේ ආකෘතිය මත පදනම්ව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ කොමසාරිස් කාර්යාලය නිර්මාණය කරන බවත්; ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ කොමසාරිස් කාර්යාලයේ බලතල සහ වගකීම් පැහැදිලිව දක්වා ඇති බවත්; සහ මෙම නීතිය මඟින් කැනඩාවේ කාන්තාවකගේ තත්වයේ භූමිකාවන් හා වගකීම් නිර්වචනය කරන බවත්ය.

**නිර්දේශය 27**

කැබිනට් මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් විශ්ලේෂණයන්හි පුහුණුව සහතික කිරීම තුළින් සහ ඊළඟ රාජාසන කතාවේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා කැනඩා රජයේ කැපවීම පැහැදිලිව ප්‍රකාශ කිරීමෙන් නායකත්වය පෙන්වන ලෙස කමිටුව කැනඩා අගමැතිවරයාට දිරිමත් කරයි.

*කැනඩාව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ඉහළ නැංවීම සඳහා ව්‍යවස්ථාදායකය සම්බන්ධ කර ගැනීම සඳහා යම් පුරෝගාමී උත්සාහයන් ගෙන ඇත. ඔවුන්ගේ පාර්ලිමේන්තු ක්‍රමය, විශේෂයෙන් අධීක්ෂණය සම්බන්ධයෙන් ගත්කල, එය ලංකාවේ ක්‍රමවේදයන්ට සමාන වන අතර, ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා වූ තේරීම් කාරක සභාවට මෙහි අධීක්ෂණ භූමිකාව අනුගමනය කළ හැක. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවයේ ප්‍රතිඵල ශක්තිමත් කිරීම සඳහා විධායකය සමඟ ඔවුන් සම්බන්ධ වීම අනුවර්තනය වීමත් සමඟ ප්‍රතිනිර්මාණය සඳහා අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වේ.*

# හතරවන ඒකකය: ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සැලසුම්කරණය සහ අයවැයකරණය තුළින් තිරසාර සංවර්ධන සැලැස්මේ අභිමතාර්ථ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සාක්‍ෂාත් කර ගැනීම

තිරසාර සංවර්ධන සැලැස්ම (2030) න්‍යාය පත්‍රයේ දක්වා ඇති කාලසීමාව තුළදී තිරසාර සංවර්ධන සැලැස්මේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුකූලව ශ්‍රී ලංකාව විසින් කැපවී සිටින අතර තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරන රජයේ ආයතන අධීක්‍ෂණය හා ඇගයීම සඳහා "ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන සභාව" ලෙස කැපවූ ආයතනයක් පිහිටුවා ඇත.

ගෝලීය පොරොන්දු හා තිරසාර පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව ජාතික ප්‍රතිපත්ති හා උපායමාර්ග සාර්ථකත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සංවර්ධනයට පහසුකම් සැලසීම, අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම තිරසාර සංවර්ධන කවුන්සිලයේ අරමුණයි. 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත මඟින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායක සහ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමක් ලබා දේ.

2030 තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය, 2015 දී සියලුම එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් සම්මත කරන ලදී. ගෝලීය අරමුණු ලෙස හැඳින්වෙන තිරසාර සංවර්ධන ඉලක්ක දුප්පත්කම තුරන් කිරීම, පෘථිවිය ආරක්ෂා කිරීම සහ සියලු මිනිසුන් සාමය සහ සෞභාග්‍ය භුක්ති විඳින බව සහතික කිරීම සඳහා වන විශ්වීය කැඳවීමකි.

මූලික අංශ තුන නම්: ආර්ථික වර්ධනය, සමාජයීය අන්තර්ග්‍රහණය කිරීම සහ පාරිසරික ආරක්ෂාව එකිනෙක මත අන්‍යෝන්‍ය ලෙස රඳා පවතින අතර ඒවා ඒකාබද්ධව ආමන්ත්‍රණය කළ යුතු ය. එසේ කිරීම සඳහා 2030 න්‍යාය පත්‍රය මඟින් තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඉදිරිපත් කෙරේ. මෙම ඉලක්ක 17 සහශ්‍ර සංවර්ධන ඉලක්කවල සාර්ථකත්වයන් මත ගොඩනැගේ. දේශගුණික විපර්යාස, ආර්ථික අසමානතාව, නවෝත්පාදනයන්, තිරසාර පරිභෝජනය, සාමය සහ යුක්තිය වැනි කොටස් නව ප්‍රමුඛතා වේ. මෙම ඉලක්ක එකිනෙකට සම්බන්ධයි - බොහෝ විට එකක් සාර්ථක කර ගැනීමට තවත් එකක් සමඟ ඇති ගැටලු විසඳිය යුතු වේ. මේ සඳහා වැදගත් වන සාධක පහක් ඇත:

**ජනතාව - පෘථිවිය - සෞභාග්‍යය - සාමය - හවුල් කටයුතු**




ඉලක්කය 1 : සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.

ඉලක්කය 2 : කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්ම ප්‍රවර්ධනය.

ඉලක්කය 3 : නීරෝගී ජීවිතයක් තහවුරු කිරීම හා සියළු දෙනාට, සෑම වයසකදීම යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

ඉලක්කය 4 : සමාන හා අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ප්‍රවර්ධනය කිරීම.

ඉලක්කය 5 : ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අත්කර ගැනීම සහ කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

ඉලක්කය 6 : සැමට ජලය ලැබීම හා තිරසාර ජල කළමණාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම.

ඉලක්කය 7 : දරාගත හැකි වූ, විශ්වස්‍ය වූ තිරසාර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම.

ඉලක්කය 8 : දරාගත හැකි, අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ තිරසාර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායී රැකියාවක් හා සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම.

ඉලක්කය 9 : ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණීය (සියළු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) සහ තිරසාර කෘෂිකාර්මිකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යමත් කිරීම.

ඉලක්කය 10 : රටවල් ඇතුලත හා රටවල් අතර ඇති අසමානතාව අඩු කිරීම.

ඉලක්කය 11 නගර හා මානව ජනාවාස අන්තර්ග්‍රහණීය, ආරක්ෂිත, ප්‍රත්‍යස්ථ හා තිරසාර බවට පත් කිරීම.

ඉලක්කය 12 : තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටා තහවුරු කිරීම.

ඉලක්කය 13 : දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම.

ඉලක්කය 14 : සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය කිරීම තිරසාර සංවර්ධනය සඳහා යොදා ගැනීම.

ඉලක්කය 15 : භෞමික පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාර ආකාරයෙන් කළමණාකරණය කිරීම, කාන්තාරකරණය වැළැක්වීම, භූමි හායනය වළක්වා එය ප්‍රතිවර්තනය කිරීම හා ජෛව විවිධත්වය අහිමිවීම නැවැත්වීම.

ඉලක්කය 16 : තිරසාර සංවර්ධනය සඳහා වූ පරිපූර්ණ සාමකාමී, අන්තර්ග්‍රණීය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණය සඳහා ප්‍රවේශය සැපයීම සහ වගකීමක් සහිත හා අන්තර්ග්‍රණය වූ ආයතන සෑම මට්ටමකම ස්ථාපිත කිරීම.

ඉලක්කය 17 : තිරසාර සංවර්ධනය, ගෝලීය සහයෝගිත්වය ක්‍රියාත්මක කිරීම, ශක්තිමත් කිරීම හා නැවත නැවත ප්‍රාණවත් කිරීම.

ඉලක්ක 17 යටතේ දර්ශක 169 ක් ඇත. විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක 9 කින් යුත් පස්වන ඉලක්කය ඇත. ඊට අමතරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන තේමාවට අදාළ වු ඉලක්ක 14 ක් යටතේ දර්ශක 80 ක් ඇත. සියලුම දර්ශක අතුරින් 34% ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ වන අතර 21% ලිංගිකත්වය පිළිබඳ වෙන් කල දර්ශක වේ.

**තිරසාර සංවර්ධන ඉලක්ක සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය**

තිරසාර සංවර්ධන ඉලක්ක වල පස්වන ඉලක්කය මුළුමනින්ම කැප වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සඳහා ය. තිරසාර සංවර්ධන ඉලක්ක වල පස්වන අභිමතාර්ථයට ඉලක්ක 9 ක් සහ දර්ශක 14 ක් ඇති අතර එය උපායමාර්ගිකව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන අතර රටේ ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානකම් විසඳයි. තිරසාර සංවර්ධන ඉලක්ක වල පස්වන ඉලක්කයට ඇතුළත් වන්නේ:

| ඉලක්ක | දර්ශක |
|---|---|
| 5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1: ස්ත්‍රී පුරුෂ පදනමින් සමානත්මතාවය හා වෙනස්කම් නොකිරීම ප්‍රවර්ධනය කිරීමට, බලාත්මක කිරීමට හා නිරීක්ෂණ කිරීමට නෛතික රාමු තිබෙන්නේද? හෝ නොතිබෙන්නේ ද යන්න |
| 5.2 මානව කුට්ටනය, ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුලත්ව කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව පොදු හා පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1: පසුගිය මාස 12 තුළ, හිංසන ආකාරයෙන් හා වයස අනුව, වර්තමාන හෝ හිටපු සමීප සහකරුවෙකු විසින් ශාරීරික, ලිංගික හෝ මානසික හිංසනයට හිංසනයට ලක්වූ කාත්තාවන් සහ වයස 15 ක් වූ ගැහැණු ළමයින්ගේ සමානුපාතිකය<br><br>5.2.2: පසුගිය මාස 12 තුළ, වයස සහ සිදුවීමේ ස්ථානය අනුව සමීප සහකරු හැර වෙනත් පුද්ගලයින් විසින් ලිංගික හිංසනයට ලක් වූ අවුරුදු 15 සහ ඊට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ සමානුපාතිකය |
| 5.3 ළමා විවාහයන්, බලහත්කාරයෙන් සිදුවන්නා වූ විවාහයන්, සහ කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම වැනි සියලුම හානිකර භාවිතයන් තුරන් කිරීම | 5.3.1: වයස අවුරුදු 15 ට පෙර සහ වයස අවුරුදු 18 ට පෙර විවාහ වී/එකට සිටින දැනට අවුරුදු 20-24 අතර වූ කාන්තාවන්ගේ සමානුපාතිකය<br><br>5.3.2: වයස අනුව ලිංගික අවයව විකෘති කිරීම/කැපීම සිදු කළ අවුරුදු 15-49 අතර ගැහැණු ළමයින් හා කාන්තාවන්ගේ සමානුපාතිකය |
| 5.4 මහජන සේවාවන් යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සැපයීම තුලින් ගෙවීමක් සිදු නොකරන්නා වූ සේවාවන් සහ ගෘහාශ්‍රිත වැඩවල වටිනාකම හඳුනා ගැනීම, අගය කිරීම, සහ ජාතික වශයෙන් සුදුසු වන්නා වූ ආකාරයට නිවසේ සහ පවුලේ වගකීම් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම. | 5.4.1: ලිංගිකත්වය ,වයස හා ස්ථානය අනුව, වැටුප් නොලබන ගෘහස්ත සහ රැකබලා ගැනීමේ කාර්යයන් සඳහා ගත කළ කාලයෙහි ප්‍රතිශතය |
| 5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම. | 5.5.1: පාර්ලිමේන්තුව සහ පළාත් පාලන ආයතනවල කාන්තාවන් දරන ආසනවල සමානුපාතිකය<br><br>5.5.2 කළමණාකාරිත්ව තනතුරු හොබවන කාන්තාවන්ගේ සමානුපාතිකය |

| ඉලක්ක | දර්ශක |
|---|---|
| 5.6 ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ වැඩසැලැස්මට අනුකූලව එකඟ වූ පරිදි සහ බීජිං ක්‍රියාකාරකම් සැලැස්ම සහ ඔවුන්ගේ සමාලෝචන සම්මන්ත්‍රණයේ ලේඛනවලට අනුකූලව ලිංගික, සහ ප්‍රජනන සෞඛ්‍යය, සහ අයිතිවාසිකම් සඳහා සියලු දෙනාටම ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම. | 5.6.1 ලිංගික සබඳතා, ගැබ්ගැනීම් වලක්වා ගැනීමේ උපක්‍රම භාවිතය සහ ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව තමන් විසින්ම ස්වකීය දැනුවත්ව තීරණ ගන්නා 15-49 වයසැති කාන්තාවන්ගේ සමානුපාතිකය<br>5.6.2 ලිංගිකත්වය, ප්‍රජනක සෞඛ්‍ය, තොරතුරු සහ අධ්‍යාපනයට ප්‍රවේශ විය හැකි වයස අවුරුදු 15- 49 අතර කාන්තාවන් සඳහා නීති රීති සහ විධිවිධාන සහතිකවන රටවල්වල සංඛ්‍යාව |
| 5. අ - කාන්තාවන්ට ආර්ථික අයිතිවාසිකම් ලබා දීම සඳහා වූ සංශෝධන සිදු කිරීමට කටයුතු කිරීම සහ දේශීය නීතිවලට අනුව ඉඩම් සහ වෙනත් ආකාරවල දේපල මූල්‍ය සේවාවන්, උරුමයන් සහ ස්වාභාවික සම්පත්වල හිමිකාරිත්වය ලබාගැනීම සහ පාලනය සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම. | 5. අ.1:<br>(අ) ලිංගිකත්වය අනුව කෘෂිකාර්මික ඉඩම්වල හිමිකාරිත්වය හෝ සුරක්ෂිත අයිතිවාසිකම් සහිත මුළු කෘෂිකාර්මික ජනගහනයේ සමානුපාතිකය; හා<br>ආ) කෘෂිකාර්මික ඉඩම් වල අයිතිකරුවන් හෝ අයිතිවාසිකම් හිමි කාන්තාවන්ගේ සමානුපාතිකය සහ ලබා දී ඇති කාල සීමාව<br>5.අ.2: ඉඩම් අයිතිය සහ/හෝ පාලනය සඳහා කාන්තාවන්ගේ සමාන අයිතිවාසිකම් (සාම්ප්‍රදායික නීතිය ද ඇතුළුව) නීතිමය රාමුව තුළ සහතික කරන රටවල සමානුපාතිකය |
| 5. ආ - කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය ඇතුලත්ව තාක්‍ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබාදීම. | 5.ආ.1: ලිංගිකත්වය අනුව ජංගම දුරකථනයක් හිමි පුද්ගලයින්ගේ සමානුපාතිකය |
| 5. ඇ - ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම සහ ශක්තිමත් කිරීම හා නීතිමය ලෙස බලාත්මක කිරීම. | දර්ශකය 5.ඇ.1: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා පොදු ප්‍රතිපාදන පද්ධති ඇති රටවල සමානුපාතිකය (ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අයවැය සම්බන්ධ දර්ශකය) |

**2020 කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් තිරසාර සංවර්ධන ඉලක්ක[vii] මත පදනම්ව ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා තත්ත්වය පිළිබඳ කෙටි සටහනක්.**

| | |
|---|---|
| 1 NO POVERTY | කෝවිඩ් 19 වසංගතය දැඩි ලෙස දිළිඳුකම වැඩි කිරීමට හේතු වන අතර එය කාන්තාවන්ට වඩාත්ම බලපායි. 2021 වන විට මිලියන 435 ක පමණ කාන්තාවන් සහ ගැහැණු ළමයින් දිනකට ඩොලර් 1.90 කටත් වඩා අඩු ආදායමකින් ජීවත් වන අතර මෙයට අමතරව කෝවිඩ් 19 හේතුවෙන් මිලියන 47 ක් දරිද්‍රතාවයට පත් වී ඇත. |
| 2 ZERO HUNGER | ගෝලීය වශයෙන් දැඩි ආහාර අනාරක්ෂිතභාවයට මුහුණ දෙන්නන්ගෙන් පිරිමින්ට වඩා කාන්තාවන්ට 27% ක ඉහළ අවදානමක් ඇත. වසංගතය හේතුවෙන් මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතරය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. |
| 3 GOOD HEALTH AND WELL-BEING | කෝවිඩ් 19 වසංගතයේ ඉදිරි පෙළේ සිටින කාන්තා සෞඛ්‍ය සේවා සේවිකාවන් වෛරසයට ගොදුරු වීමේ අවදානම වැඩි ය. ලබා ගත හැකි දත්ත ඇති රටවල් පහක ආසාදිත සෞඛ්‍ය සේවකයින් අතර 72% ක් කාන්තාවන් ය. |
| 4 QUALITY EDUCATION | පාසැල් වැසීම හේතුවෙන් අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතරය වැඩි වීමට ඉඩ ඇත. පූර්ව ප්‍රාථමික පාසලේ සිට තෘතීයික අධ්‍යාපන වයස දක්වා මිලියන 11 කට වැඩි ගැහැණු ළමයින් 2020 දී නැවත පාසැල් නොපැමිණීමේ අවදානමට ලක්ව සිටිති. |
| 5 GENDER EQUALITY | ඇස්තමේන්තු කර ඇති පරිදි, පසුගිය වසරේ සමීප සහකරුවෙන්ගෙන් වයස අවුරුදු 15 - 49 ත් අතර වයසේ පසුවන කාන්තාවන් සහ ගැහැණු ළමයින් මිලියන 243 ක් ලිංගික හා/හෝ ශාරීරික හිංසනයට ලක් වී ඇත.<br><br>ලිංගික අවයව විකෘති කිරීම සිදු කරන රටවල් 31 ක මෑතකාලීන දත්ත වලට අනුව හෙළි වී ඇති පරිදි, අවම වශයෙන් ගැහැණු ළමයින් සහ කාන්තාවන් මිලියන 200 ක් පමණ ලිංගික අවයව විකෘති කිරීමට (FGM) ලක් වී ඇත.<br><br>ගෝලීය වශයෙන්, වයස අවුරුදු 20 ත් 24 ත් අතර වයසේ පසුවන සෑම කාන්තාවන් 5 දෙනෙකුගෙන්ම 1 ක් විවාහ වී ඇත්තේ ළමා අවධියේදී ය. වසංගතය ඇතිවීමට පෙර ළමා විවාහ සහ ලිංගික අවයව විකෘති කිරීමට (FGM) පහත යමින් තිබුණි. කෙසේ වෙතත්, ආර්ථික දුෂ්කරතා සහ පාසල් බාධා හේතුවෙන් මෙම තත්ත්වය වැඩි වීමක් විය හැකිය. සෑම දිනකම කාන්තාවන් පිරිමින් මෙන් පැය 3 කට වඩා වැඩියෙන් ගෙවන්නේ වැටුප් නොලබන ගෘහස්ථ රැක බලා ගැනීමේ සහ ගෙදර වැඩ සඳහා ය. කෝවිඩ් 19 හේතුවෙන් කාන්තාවන්ගේ නොගෙවූ රැක බලා ගැනීමේ සේවා වැඩි වී ඇත.<br><br>ලොව පුරා, පාර්ලිමේන්තු ආසන 4 න් 1 ක් හිමි වන්නේ කාන්තාවන්ටය. ප්‍රාදේශීය මට්ටමින්, කාන්තාවන් (36%) ක් ආසන හිමිකරගෙන ඇත. |
| 6 CLEAN WATER AND SANITATION | ලෝකයේ සෑම පාසල් 10 න් 4 ක් සහ අවම වශයෙන් 70% ක් සංවර්ධනය වෙමින් පවතින රටවල් - සිසුන්ට මූලික සනීපාරක්ෂක පහසුකම් සැපයීමේදී අභියෝගයන්ට මුහුණ දෙයි. සමහර රටවල පාසල් වල ගැහැණු ළමුන් 150 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට එක් වැසිකිලියක් භාවිතා කිරීමට සිදු වේ. |

**7 AFFORDABLE AND CLEAN ENERGY**

2016 දී කාන්තාවන් සහ ගැහැණු ළමයින් අතර මිලියන 2 කට ආසන්න මරණ සංඛ්‍යාවක් සිදු වූයේ පිරිසිදු ඉවුම් පිහුම් ඉන්ධන සහ ඒ සම්බන්ධ තාක්‍ෂණය නොමැතිකම හේතුවෙනි.

**10 REDUCED INEQUALITIES**

ආබාධ සහිත කාන්තාවන් විවිධ ආකාරයේ වෙනස් කොට සැලකීම් වලට මුහුණ දෙති. සෑම ආබාධ සහිත කාන්තාවන් සහ පිරිමින් 10 දෙනෙකුගෙන් 3 දෙනෙකු 2014 සහ 2019 අතර අවම වශයෙන් කුමන හෝ ආකාරයක වෙනස් කොට සැලකීමකට මුහුණ දී ඇත.

**8 DECENT WORK AND ECONOMIC GROWTH**

වසංගතය හේතුවෙන් ගෘහ සේවිකාවන් සහ අවිධිමත් ආර්ථික රැකියාවල නියුක්ත වූවන් විශේෂයෙන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත. වැඩිපුරම කාන්තාවන් වන ගෘහ සේවිකාවන්ගෙන් 72% කට ආසන්න සංඛ්‍යාවක් රැකියා අහිමි වීම හෝ ගෙවන පැය ගණන අඩු කිරීම සිදු වී ඇත.

**9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE**

වසංගතය හේතුවෙන් නිෂ්පාදන අංශය විශාල රැකියා අහිමිවීමකට හා ආර්ථික නිමැවුමේ අඩුවීමක් සිදු වී ඇත. කාන්තාවන් බොහෝ විට එම අංශයේ අවදානමට ලක්විය හැකි රැකියාවල නියුක්ත වන අතර ඔවුන්ගේ රැකියා හෝ ජීවනෝපායන් අහිමි වීමේ අවදානම වැඩිය.

**12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION** **13 CLIMATE ACTION** **14 LIFE BELOW WATER** **15 LIFE ON LAND**

වැඩිවන දේශගුණික විපත් වල පීඩාවන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් වැඩියෙන් බලපානු ලබන අතර ඔවුන්ට එහි වෙනසක් කිරීමට දායක විය හැක්කේ කලාතුරකින්ය. එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවේ (COP 25) හි නියෝජිත කණ්ඩායමේ ප්‍රධානීන් වූයේ කාන්තාවන් 25% පමණි.

**11 SUSTAINABLE CITIES AND COMMUNITIES**

දුප්පත් නාගරික කාන්තාවන්ගේ ආරක්ෂිත හා විශ්වාසදායක පොදු ප්‍රවාහන පහසුකම් තම ජීවන මාර්ගයට මහත් ශක්තියක් විය හැකි නමුත් බොහෝ නාගරික පසුබිමක ඒ සඳහා ප්‍රවේශය ප්‍රමාණවත් නොවේ. පොදු ප්‍රවාහන සේවාවන් සඳහා පහසු ප්‍රවේශය ඇත්තේ ජනගහනයෙන් 50% කට පමණක් බව 2019 ලබාගත් දත්ත පෙන්වා දී ඇත.

**16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS**

කාන්තාවන් පාලනයේ නිරත රටවල, කෝවිඩ් 19 වලින් තහවුරු වූ මරණ භය ගුණයකින් අඩු ය. එසේම, සාම ක්‍රියාවලියන් සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය කල් පවත්නා ගිවිසුම් සඳහා මුලපුරා ඇති බව පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, 1992 සහ 2019 අතර කාලය තුළ කාන්තාවන් සාම ක්‍රියාවලීන්හි සමථකරණය සඳහා 6% ක්, තීරණ දරන්නන්ගෙන් 6% ක් සහ කථා බස් කොට එකඟතාවන්ට එළඹෙන්නන්ගෙන් 13% ක් පමණි.

**17 PARTNERSHIPS FOR THE GOALS**

ගෝලීය වශයෙන්, මිනිසුන් බිලියන 4.1 ක් දැන් අන්තර්ජාලයේ භාවිතා කරයි, නමුත් පිරිමින්ගෙන් 58% ට සාපේක්ෂව කාන්තාවන් ඇත්තේ 48% ක් පමණි. සමහර සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශ වල එම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතරය වැඩි වෙමින් පවතී.

## පස්වන ඒකකය : ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව සහ ප්‍රතිපාදන

2022 අයවැය යෝජනා කැඳවීමේ සඳහන් පරිදි ජාතික සැලසුම් හා අයවැය ක්‍රියාවලියට මඟ පෙන්වන ජාතික ප්‍රතිපත්ති රාමුවේ අරමුණ රට හදන සෞභාග්‍යයේ දැක්මයි. මෙම ප්‍රතිපත්තියේ දැක්ම වන්නේ "ඵලදායි පුරවැසියෙක්, සතුටින් ජීවත් වන පවුලක්, විනයගරුක සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක්" යන්නයි. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ දක්වා ඇති ප්‍රධාන ප්‍රතිපත්ති දහයක් ඇති අතර

i. ඵලදායි පුරවැසියෙක් සහ සශ්‍රීක මානව සම්පතක්,
ii. ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්,
iii. විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක් යන ප්‍රතිපත්ති තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය විශේෂයෙන් ඇතුළත් වේ.

ජාතික ප්‍රතිපත්ති රාමුව තිරසාර සංවර්ධන සැලැස්මේ ප්‍රධාන සංවර්ධන ඉලක්කයන් අනුගමනය කරන අතර එම ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සහ ලෝක සන්තෝෂ දර්ශකයේ ඉහළම තලයට ශ්‍රී ලංකාව ගෙන ඒම සඳහා ප්‍රමුඛතාවය සහතික කෙරේ (දැනට ශ්‍රී ලංකාව රටවල් 149 ක් අතුරින් 129 වන ස්ථානයේ පසුවෙයි).

රටේ සංවර්ධනය සඳහා ඉතා පැහැදිලිව කාන්තාවන්ගේ දායකත්වය ප්‍රයෝජනයට ගැනීමේ වැදගත්කම ජාතික ප්‍රතිපත්ති රාමුවක් ලෙස රට හදන සෞභාග්‍යයේ දැක්මේ දක්වා ඇත. මෙම ප්‍රතිපත්තියට කාන්තාවන් ශ්‍රම බලකාය තුළ පූර්ණ ලෙස සම්බන්ධ කර ගැනීමට සහ රටේ ආර්ථික වර්ධනය සඳහා ඵලදායි ලෙස සහභාගී කර ගැනීම සඳහා විවිධ උපාය මාර්ග ඇතුළත් කර ඇත. (ජාතික ප්‍රතිපත්ති රාමුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විශ්ලේෂණය සඳහා කරුණාකර ඇමුණුම III බලන්න.)

## ඇමුණුම I : ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය තත්ත්වය පිළිබඳ සංඛ්‍යානමය දළ විශ්ලේෂණය

| **දත්ත කාණ්ඩය** | **සමස්ත / මුළු** | **ස්ත්‍රී** | **පුරුෂ** | **සමස්ත / මුළු** | **ස්ත්‍රී** | **පුරුෂ** |
|---|---|---|---|---|---|---|
| | **2015** | | | **2019** | | |
| **ගෝලීය දර්ශක දත්ත** | | | | | | |
| මානව සංවර්ධන දර්ශක[viii] | 0.766 (තත්වය 73/188) | 0.734 | 0.785 | 0.782 (තත්වය 72/189) | 0.759 | 0.794 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතා දර්ශකය [ix] දර්ශක සහිතව | 0.386 (තත්වය 87/188) | | | 0.401 (තත්වය 90/189) | | |
| ▪ *මාතෘ මරණ අනුපාතය (සජීවී උපත් 100,000 කට මරණ)* | 30 | | | 36 | | |
| ▪ *නව යොවුන් වියේ උපත් අනුපාතය (අවුරුදු 15-19 අතර කාන්තාවන් 1000කට උපත්)* | 14.8 | | | 20.9 | | |
| ▪ *කාන්තාවන්ට හිමි පාර්ලිමේන්තු ආසන වල කොටස* | | 4.9% | | 5.30% | | |
| ▪ *අවම වශයෙන් ද්විතීයික අධ්‍යාපන මට්ටම් සහිත ජනගහනය (අවුරුදු 25 සහ ඊට වැඩි ප්‍රතිශතය)* | 80.5 % | 80.2% | 80.6% | | 79.20% | 81.00% |
| ▪ *ශ්‍රම සහභාගීත්ව අනුපාතය (අවුරුදු 15 සහ ඊට වැඩි ප්‍රතිශතය)* | 53.80% | 35.9% | 74.7% | 52.30% | 35.40% | 74.60% |
| ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතරය පිළිබඳ දර්ශකය (GGGI)[x] | 0.686 (තත්වය 84/145) | | | 0.680 (තත්වය 102/153) | | |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවර්ධන දර්ශකය [xi], [xii] දර්ශක සමග | 0.934 කණ්ඩායම 3[xiii]) | | | 0.955 (කණ්ඩායම 2) | | |
| ▪ *ආයු අපේක්ෂාව (අවුරුදු)* | 75.0 | 78.4 | 71.3 | 77.0 | 80.3 | 73.6 |
| ▪ *අපේක්ෂිත පාසල් අධ්‍යාපන ලබන වර්ෂ (අවුරුදු)* | 14.0 | 14.3 | 13.6 | 14.1 | 14.5 | 13.8 |
| ▪ *මධ්‍ය පාසල් අධ්‍යාපන ලබන වර්ෂ (අවුරුදු)* | 10.9 | 10.3 | 11.4 | 10.6 | 10.6 | 10.6 |
| ▪ *දළ ජාතික ආදායම - මිලදී ගැනීමේ බලය මත පදනම්ව* | 10,789 | 6067 | 15,869 | 12,707 | 7433 | 18,423 |
| කාන්තා සාමය හා ආරක්ෂක දර්ශකය (WPS) ( WPS දර්ශකය 2019/20) | 0.656 ( 2017-2018) | | | 0.679* | | |
| **ජන විකාශනය** | | | | | | |
| ජනගහනය (1000) [xiv] (ඇස්තමේන්තු) | 20660 | 53.20% | 46.80% | 21803^ | 52% | 48% |

| දත්ත කාණ්ඩය | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2019 | | |
| ජනගහනයේ වයස් බණ්ඩනය (1000) | | | | | | |
| අවුරුදු 0-14 | 5289 | 2619 | 2670 | 5504 | | |
| අවුරුදු 15- 64 | 14033 | 7260 | 6773 | 14589 | | |
| අවුරුදු 65 සහ ඉහළ | 1648 | 938 | 710 | 1710 | | |
| උපතේදී ස්ත්‍රී පුරුෂ අනුපාතය | 1.04 | | | 1.04 | | |
| සශ්‍රීකත්ව අනුපාතය | 2.21 | | | 2.2 | | |
| උපතේදී ආයු අපේක්ෂාව (අවුරුදු) | 75 | 79.6 | 73.1 | 77 | 80.3 | 73.6 |
| ළදරු මරණ අනුපාතය | 7 | 6.7 | 8.2 | 6.1 | 5.9 | 6.6 |
| දළ උපත් අනුපාතිකය | 15.6 | | | 14.6 | 13.9 | 15.4 |
| දළ මරණ අනුපාතිකය | 6.2 | | | 6.6 | 5.3 | 6.9 |
| මරණ | 130765 | | | 146053 | 62187 | 77311 |
| ගෘහස්ත ජනගහනය/ කාන්තා මූලික පවුල් [xv] (1000) | 5437 | 74.20% | 25.80% | | | |
| **ශ්‍රම බලකාය** [xvi] | | | | | | |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය % [xvii] | 53.8 | 35.9 | 74.7 | 52.3 | 34.5 | 73 |
| රැකියාවේ නියුතු (000) | 7948 | 2733 | 5097 | 8181 | 2811 | 5368 |
| කෘෂිකර්මාන්තයේ | 27.10% | | | 25.30% | | |
| කර්මාන්තයේ | 26.40% | | | 27.60% | | |
| සේවා තුළ | 46.50% | | | 47.10% | | |
| රාජ්‍ය අංශය | 53.50% | | | 52.50% | | |
| පළාත් රාජ්‍ය අංශය | 29.30% | | | 30.30% | | |
| අර්ධ රාජ්‍ය අංශය | 17.20% | | | 17.20% | | |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය | 8214473 | 36% | 64% | 8592010 | 35.40% | 64.60% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය - නාගරික අංශය | 1253519 | 33.10% | 66.90% | 1425479 | 35% | 65.00% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය - ග්‍රාමීය අංශය | 6577732 | 36.10% | 63.90% | 6749448 | 35.10% | 64.90% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය - වතු අංශය | 383221 | 44.90% | 55.10% | 417083 | 41.50% | 58.50% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහනය [xviii] | 7067473 | 74.80% | 25.20% | 7832006 | 73.70% | 26.30% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහනය - නාගරික අංශය | 1324940 | 72.90% | 27.10% | 1411397 | 72.80% | 27.20% |

| දත්ත කාණ්ඩය | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2019 | | |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහනය - ග්‍රාමීය අංශය | 5518880 | 75.40% | 24.60% | 6141938 | 74.20% | 25.80% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහනය - වතු අංශය | 223652 | 71.80% | 28.20% | 278626 | 68.30% | 31.70% |
| ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන (පහත හේතු අනුව) | | | | | | |
| අධ්‍යන කටයුතුවල නිරත වේ | 20.30% | 14.00% | 38.90% | 21.20% | 14.60% | 39.20% |
| ගෙදර වැඩ වල නියැලෙයි | 47.40% | 61.40% | 5.90% | 47.20% | 62.40% | 4.30% |
| විශ්‍රාමික/ මහලු වයස | 21.40% | 16.90% | 34.80% | 20.30% | 15.50% | 33.70% |
| ශාරීරික අසනීප/ ආබාධිත | 7.1%% | 4.8% | 13.70% | 8.20% | 5.20% | 16.60% |
| වෙනත් | 3.80% | 2.8% | 6.80% | 3.30% | 2.30% | 6.10% |
| රැකියා තත්ත්වය අනුව රැකියා කරන ජනගහනය | | | | | | |
| සේවකයා | 56.1% | 55.10% | 65.7% | 57.90% | 58.30% | 57.70% |
| සේවකයා රාජ්‍ය අංශය | 15.1% | 19.3% | 12.8% | 14.90% | 19.90% | 12.20% |
| සේවකයා පෞද්ගලික අංශය | 41.00% | 35.8% | 43.90% | 43.00% | 38.40% | 45.50% |
| සේවායෝජකයා | 3.10% | 1.1% | 4.2% | 2.60% | 0.80% | 3.50% |
| තමන්ගේම රැකියාවක නිරත සේවකයෙක් | 32.20% | 26.9% | 73.1% | 32.50% | 24.80% | 36.50% |
| පවුලේ ව්‍යාපාරයකට දායක වීම | 8.40% | 78.0% | 22.0% | 7.00% | 16.10% | 2.30% |
| **විරැකියාව** | | | | | | |
| විරැකියා අනුපාතය | 4.7 | 7.2 | 3.0 | 4.8 | 7.4 | 3.3 |
| විරැකියා අනුපාතය - 5 සහ ඊට අඩු ශ්‍රේණි | 0.7 | 1.5 | 0.3 | 1.0 | 0.7 | 1.6 |
| විරැකියා අනුපාතය - 6 - 10 දක්වා ශ්‍රේණි | 3.4 | 5.4 | 2.6 | 3.30 | 2.90 | 4.50 |
| විරැකියා අනුපාතය - අ.පො.ස සාමාන්‍ය පෙළ | 6.4 | 9.0 | 5.1 | 3.3 | 4.5 | 2.9 |
| විරැකියා අනුපාතය - අ.පො.ස උසස් පෙළ සහ ඉන් ඉහළ | 9.2 | 13.5 | 4.7 | 8.5 | 11.9 | 5.0 |
| තරුණ විරැකියා අනුපාතය | 20.8 | 27.4 | 16.6 | 21.5 | 28.7 | 17.6 |
| තරුණ විරැකියා අනුපාතය - 5 සහ ඊට අඩු ශ්‍රේණි | 4.8 | | | 12.8 | | |
| තරුණ විරැකියා අනුපාතය - 6 - 10 දක්වා ශ්‍රේණි | 14.8 | | | 15.7 | | |
| තරුණ විරැකියා අනුපාතය - අ.පො.ස සාමාන්‍ය පෙළ | 23.9 | | | 22.5 | | |
| අ.පො.ස උසස් පෙළ සහ ඉන් ඉහළ | 34 | | | 30.7 | | |
| අධ්‍යාපනය, රැකියාව හෝ පුහුණුවීම් වල නියුතු නොවන තරුණයින් | 734,550 | 510,049 | 224,501 | 647,009 | 445,820 | 202,043 |

| දත්ත කාණ්ඩය | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2019 | | |
| | | | | | | |
| අවිධිමත් අංශය සඳහා රැකියා දායකත්වය % | 59.8 | 53.7 | 63.2 | 57.4 | 51.1 | 60.8 |
| විධිමත් අංශය සඳහා රැකියා දායකත්වය % | 40.2 | 46.3 | 36.8 | 42.6 | 48.9 | 39.2 |
| පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා පිටත් වීම | 82098 | 5.70% | 94.30% | | | |
| දරිද්‍රතා දර්ශකය [xix] | 4.1 | | | 4.1 | | |
| බහුමාන දරිද්‍රතා දර්ශකය [xx] | | | | 0.011 (2.9%)<br>2016 දී | | |
| දැඩි බහුමාන දුප්පත්කම සහිත ජනගහනය [xxi] | | | | 0.3% | | |
| **අධ්‍යාපන** | | | | | | |
| සාක්ෂරතා අනුපාතය අවුරුදු 10 ට වැඩි [xxii] | 93.2% | 92.40% | 94.10% | 92.90% | 92.30% | 93.40% |
| පරිගණක සාක්ෂරතාව [xxiii] | | | | 30.8 | 28.9 | 32.9 |
| ඩිජිටල් සාක්ෂරතාවය | | | | 46.0 | 42.6 | 49.7 |
| පාසල් ඇතුළත් කර ගැනීම - ප්‍රාථමික | 100% | 100.5% | 102.7% | 100.1% (2018) | 99.6% | 100.6% |
| පාසල් ඇතුළත් වීම - ද්විතීයික | 97.6% (2016)[xxiv] | 99.28% | 95.98% | 100% ( 2018) | 102% | 98.0% |
| 5 ශ්‍රේණිය විභාගය | 31,853 | 17470<br>54.8% | 14383<br>45.1% | 47,667 | 25,740<br>54% | 21926<br>46% |
| අ.පො.ස සා/පෙළ කාර්යසාධන මට්ටම අනුව උසස් පෙළ සඳහා සුදුසුකම් ලබන ප්‍රතිශතය [xxv] | 195,358 | 111,567<br>57.1% | 83,791<br>42.8% | 225539 | | |
| අ.පො.ස උසස් පෙළ කාර්යසාධන මට්ටම අනුව විශ්ව විද්‍යාලයට අයදුම් කිරීමට සුදුසුකම් ලබන (නව සහ පැරණි විෂය නිර්දේශය දෙකම) | 131,137 | 84,448<br>64.3% | 46,689<br>35.6% | 181,126 | 118064<br>65.1% | 63062<br>34.8% |
| **අධ්‍යයන වැඩසටහන අනුව උපාධි අපේක්ෂකයින් ඇතුළත් කර ගැනීම** | | | | | | |
| කලා | 9418 | 7742 | 1676 | 12,009 | 10147 | 1867 |
| වාණිජ | 5793 | 3740 | 2053 | 7807 | 5199 | 2608 |
| භෞතික විද්‍යාව | 6023 | 1807 | 4216 | 7874 | 2607 | 5267 |
| ජීව විද්‍යාව | 7032 | 4807 | 2225 | 9805 | 6979 | 2826 |
| වෙනත් (විවිධ විෂය සංයෝජන) | 324 | 142 | 182 | 545 | 238 | 307 |
| ඉංජිනේරු තාක්ෂණය | 1215 | 183 | 1032 | 2095 | 333 | 1762 |
| ජෛව පද්ධති තාක්‍ෂණය | 857 | 685 | 172 | 1506 | 1203 | 303 |
| වෛද්‍ය | | | | 1967 | 1271 | 696 |
| නීති | | | | 493 | 420 | 73 |
| දන්ත ශල්‍යකර්ම | | | | 120 | 84 | 36 |

| දත්ත කාණ්ඩය | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2019 | | |
| පශු වෛද්‍ය | | | | 128 | 89 | 39 |
| කෘෂිකර්ම | | | | 2463 | 1780 | 683 |
| ඉංජිනේරු | | | | 2466 | 620 | 3646 |
| විලාසිතා නිර්මාණකරණය | | | | 164 | 109 | 55 |
| පරිගණක විද්‍යාව | | | | 2325 | 1075 | 1250 |
| සම සෞඛ්‍ය විද්‍යා | | | | 1242 | 932 | 310 |
| දේශීය වෛද්‍ය විද්‍යාව | | | | 715 | 545 | 170 |
| තාක්ෂණය | | | | 3396 | 1444 | 1952 |
| **සෞඛ්‍ය** | | | | | | |
| ජනගහනය (1000 කට) උපත් අනුපාතිකය | 17.9 | | | 15.2 | | |
| දළ මරණ අනුපාතිකය | 6.2 | 5.3 | 7.1 | 6.6 | | |
| සජීවී උපත් වල ස්ත්‍රී පුරුෂ අනුපාතය | 1.04 | | | 1.04 | | |
| මාතෘ මරණ අනුපාතය (සජීවී උපත් 100000 කට මරණ) දිස්ත්‍රික්ක අනුව | 30 | | | 36 | | |
| ළදරු මරණ අනුපාතය | 7 | 6.7 | 8.2 | 6.1 | 5.9 | 6.6 |
| උපත් සඳහා සහභාගී වන පුහුණුව ලත් සෞඛ්‍ය සේවකයින් | 99.5 | | | 99.5 (2016) | | |
| රෝහල තුල දරුවන් ප්‍රසූත කිරීමේ ප්‍රතිශතය | 99.9% | | | 99.9% | | |
| නව යොවුන් වියේ පසුවන ගැබිනි මව්වරුන්ගේ ලියාපදිංචි ප්‍රතිශතය | 5.25 | | | 4.4 | | |
| ගැබිනි කාලය තුලදී අවම වශයෙන් එක් වතාවක් වත් රැකවරණ සේවා ලද | 98.8 % | | | 98.80% | | |
| ළදරු මරණ (සජීවී උපත් 1000 කට) | 9.16 | | | 10.1 | | |
| සශ්‍රීකත්ව අනුපාතය [xxvi] | 2.1 | | | 2.2 | | |
| නව යොවුන් වියේ උපත් අනුපාතය ( අවුරුදු 15-19 වයසේ කාන්තාවන් 1000 කට උපත් ) | 14.8 | | | 20.9 | | |
| උපත් පාලන ක්‍රම භාවිතය (වයස අවුරුදු 15-49 අතර කාන්තාවන්ගේ ප්‍රතිශතය) | 64.6 | | | 61.7 | | |
| දළ මරණ අනුපාතිකය | 6.2 | 5.3 | 7.1 | 6.6 | | 7.6 |
| **කාන්තා සවිබල ගැන්වීම** | | | | | | |
| පාර්ලිමේන්තුවේ කාන්තා ආසන | 4.9% | | | 5.30% | | |

| දත්ත කාණ්ඩය | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ | සමස්ත / මුළු | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2019 | | |
| පළාත් පාලන ආයතන වල ආසන කොටස | | | | 10.9 | | |
| කාන්තා නීති සම්පාදකයින්, ඉහළ නිලධාරීන් සහ කළමනාකරුවන් | | | | 28.4 | | |
| රජයේ පාසල්වල කාන්තා විදුහල්පතිවරුන් (2017)<br>ජාතික පාසල්<br>පළාත් පාසල් | 28.5%<br>21.9% | | | | | |
| පාර්ලිමේන්තු මැතිවරණයේ අපේක්ෂකයින් | | 9.3 % | 90.70% | | | |
| පළාත් පාලන ආයතන මැතිවරණයේ අපේක්ෂකයින් (2018) | | 32.30% | 67.80% | | | |
| අනිවාර්ය වැටුප් සහිත මාතෘ නිවාඩු | | | | දින 118[xxvii] | | |
| මූල්‍ය ආයතන වල ගිණුමක් ඇති කාන්තාවන්, හෝ ජංගම මුදල් සේවා සැපයුම්කරු (වයස අවුරුදු 15 සහ ඊට වැඩි කාන්තා ජනගහනයේ ප්‍රතිශතය)[xxviii] | | | | 73.4 | | |
| විද්‍යා, තාක්‍ෂණ, ඉංජිනේරු සහ ගණිත උපාධිධාරීන්ගේ කොටස [xxix] | | | | 40.6% | | |
| වයස අවුරුදු 18 දී විවාහ වූ කාන්තාවන් [xxx] | | | | 10% | | |

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය**

2019 දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශයට පත් කළ “කාන්තා යහපැවැත්ම පිළිබඳ ජාතික අධ්‍යයනය” හි පහත දත්ත ඇත:

**සහකරුවෙක් ඇති කාන්තාවන් අත්විඳ ඇති:**

- ශාරීරික හිංසනය 18.9%
- ලිංගික හිංසනය 6.8%
- මානසික හිංසනය (27.9%)
- ආර්ථික හිංසනය (18.1%)

**ශ්‍රී ලාංකික කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙක් තම ජීවිත කාලය තුළ එක් ආකාරයක හිංසනයකට වඩා මුහුණ දී තිබේ.**

- 19.1% කාන්තාවන් තම හැසිරීම් පාලනය කිරීම අත්විඳ ඇත.
- සෑම ආකාරයකම හිංසනයන් තරුණ කාන්තාවන් අතර වැඩිය.
- හිංසනයට මුහුණ දුන් කාන්තාවන් 14.6% ක් සියදිවි නසා ගැනීමට උත්සාහ කළහ.
- හිංසනයට මුහුණ දුන් කාන්තාවන්ගේ දරුවන්, 4.5% ක් දරුවන් පාසලෙන් ඉවත් විය, 21.2% ක් බියකරු හීන ගැන පැමිණිලි කළහ.
- ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වතු අංශය - 37.9%, ග්‍රාමීය අංශය - 18.6%, නාගරික අංශය - 15.7% .
- 47.5% ක් කාන්තාවන් පවසා ඇත්තේ පිරිමින්ට මුල් තැන දිය යුතු බවයි.
- 46.5%ක් කාන්තාවන් පවසා ඇත්තේ කාන්තාවන් තම ස්වාමිපුරුෂයා කියන දේට එකඟ නොවුණත් ඔහුට කීකරු විය යුතු බවයි.
  - කාන්තාවන් 39.5% ක් කියා සිටියේ තම සැමියා සමඟ ලිංගික සංසර්ගයේ යෙදීම බිරිඳගේ යුතුකම බවයි (අවස්ථාව අනුව එසේ ලිංගිකව හැසිරීමට බිරිඳ අකමැති වුවත්).
  - ප්‍රබල අවදානම්: බීමතින් සිටිනා පුරුෂයින්, වෙනත් පිරිමින් සමඟ රණ්ඩු වන මිනිසුන්, අනියම් විවාහ සම්බන්ධතා පවත්වන පිරිමි



## ඇමුණුම II - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී අයවැය කෙරෙහි අවධානය යො
## රාජ්‍ය අමාත්‍යාංශයේ 01/2021 චක්‍ර ලේඛය ඇමිණීම)

<u>අදාළ අමාත්‍යාංශවල සහ රාජ්‍ය අමාත්‍යාංශවල වාර්ෂක ක්‍රියාකාරී සැලැසුම් සඳහා යෝජිත ක්ෂේත්‍ර</u>

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තා ආර්ථික සවිබල ගැන්වීම**

**අරමුණ -** සංවර්ධන සැළසුම් සඳහා කාන්තාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම තුළින් ආර්ථික සංව
වන කාන්තා පරපුරක් බිහි කිරීම.

| | උපාය මාර්ගය | ක්‍රියාකාරකම | |
|---|---|---|---|
| 1 | තීරණ ගන්නා මට්ටම්වල කාන්තා නායකත්වය සඳහා සමාන අවස්ථා උදා කරලීමටත්, සඵලදායී කාන්තා සහභාගීත්වයක් තහවුරු කිරීම පිණිසත්, දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම | I. පළාත් පාලන මට්ටමේ දැනට ක්‍රියාත්මක වන කාන්තා නියෝජනය සඳහා වූ කෝටා ක්‍රමය, පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ දක්වා පුළුල් කිරීම.<br>II. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් සභා මැතිවරණ සඳහා තරඟ කරනු ලබන කාන්තා අපේක්ෂිකාවන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා ප්‍රතිපාදන වෙන් කිරීම.<br>III. පළාත් පාලන ආයතන සඳහා දැනට තේරී පත්ව සිටින දේශපාලන කාන්තා නියෝජිතවරියන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම තුළින්, ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සඵල දායකත්වය ලබා ගැනීම. | |
| 2 | ආර්ථික සංවර්ධනයේ කාන්තා දායකත්වය ඵලදායී ලෙස ඉහළ නැංවීමට පහසුකම් සැලසීම | ශ්‍රම බලකායට කාන්තා දායකත්වය ඉහළ නැංවීම උදෙසා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම, ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යාම, විධිමත්ව නියාමනය කිරීම හා තරුණ මව්වරුන් සඳහා නම්‍යශීලී වැඩ කිරීමේ අවස්ථා ඇති කිරීම. | |
| 3 | කාන්තා ව්‍යවසායකත්වය ඉහළ නැංවීම තුළින් කාන්තාව, දේශීය සහ අපනයන ආර්ථිකයට දායක කර වීම | I. නිෂ්පාදන සමූපාකාර ක්‍රමය මගින් තරුණ හා කාන්තා ව්‍යවසායකයින් වර්ධනය කිරීම.<br>II. අත්යන්ත්‍ර, බතික්, ඇඟළුම්, ගෙත්තම්, ලේස්, වේවැල්, කුඹල් කර්මාන්තය, කෙඳි ආශ්‍රිත නිෂ්පාදන, කරවල හා ධීවර කර්මාන්තය වැනි කුඩා | |

## මු කළ යුතු කරුණු (2022 අයවැය යෝජනා කැඳවීමට අදාළ කාන්තා හා ළමා කටයුතු

ර්ධන ක්‍රියාවලියට දායක

| | හඳුනාගත් කාර්ය සාධක දර්ශකය | තිරසර සංවර්ධන දර්ශකය | අමාත්‍යාංශය / රාජ්‍ය අමාත්‍යාංශය |
|---|---|---|---|
| | I. පළාත් සභාවල සහ පාර්ලිමේන්තුවේ දේශපාලන කාන්තා නියෝජිත ප්‍රතිශතය<br>II. ධාරිතා සංවර්ධනය කරන ලද දේශපාලන කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව<br>III. සංවර්ධන සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී දායක වූ පලාත් පාලන නියෝජිතයන්ගේ ප්‍රතිශතය | **5.5.1.අ.** ජාතික පාර්ලිමේන්තුවේ, පළාත් පාලන ආයතනයන්හි කාන්තාවන් විසින් දරණු ලබන ආසන ප්‍රමාණය<br><br>**5.5.2.** විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය | 1. කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය<br>2. ජාතික කාන්තා කමිටුව<br>3. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය<br>4. මැතිවරණ කොමිෂන් සභාව |
| | I. දිවා සුරකුම් මධ්‍යස්ථාන සහ නම්‍යශීලී වැඩපරිසරයක් ඇති කර ගත් අමාත්‍යාංශ/ආයතන ගණන<br>II. විවිධ සංවර්ධන අංශ යටතේ ශ්‍රම බලකායට කාන්තා සහභාගීත්වය වැඩි වූ ප්‍රතිශතය | **8.5.2 –** ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන්ට අදාළ ව විරැකියා අනුපාතය<br>**5.5.2 –** විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය<br>**5.4.1 -** ස්ත්‍රී පුරුෂ භාවය වයස සහ ස්ථානය අනුව වැටුප් නොලබන ගෘහාශ්‍රිත හා රැකබලා ගැනීමේ කාර්යයන් වෙනුවෙන් වැය කරන කාල ප්‍රමාණය | 1. කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය ඇතුළුව<br><br>2. සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ හා ආයතන |
| | I. කුඩා හා මධ්‍ය පරිමාණ කාන්තා ව්‍යවසායකයින් වැඩි වීමේ ප්‍රතිශතය<br>II. ව්‍යවසායකයන් සඳහා ඇති වූ නව වෙළඳපොළවල් ප්‍රමාණය<br>III. විදේශ වෙළඳපොල සඳහා වූ කෘෂිකාර්මික හා | **10.2.1** – ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධිත තත්ත්වය හා සාධකයන් අනුව මධ්‍ය ආදායමෙන් 50% කට වඩා පහළින් ජීවත් වන ජනගහනයේ ප්‍රමාණය<br>**8.5.1** – රැකියාව, වයස සහ ආබාධ සහිත | **1.** සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>**2.** වී හා ධාන්‍ය, කාබනික ආහාර, |

| | උපාය මාර්ගය | ක්‍රියාකාරකම | |
|---|---|---|---|
| | | හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>III. අපනයන අභිමුඛ කර්මාන්ත සඳහා තරුණ කාන්තා හා පිරිමි ව්‍යවසායකයන් සඳහා අවස්ථා හා දිරිගැන්වීමේ ක්‍රමයක් ඇති කිරීම.<br>IV. ගෘහස්ථ කර්මාන්තවල නියැලෙන ග්‍රාමීය කාන්තාවන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම | |
| 4 | කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම | I. කාබනික පොහොර භාවිතය මඟින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගෙවතු මිලියන 2 ක් පමණ සංවර්ධනය කිරීම<br>II. නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීම සහ කාබනික පෙහොර නිෂ්පාදනය | |

| | හඳුනාගත් කාර්ය සාධක දර්ශකය | තිරසර සංවර්ධන දර්ශකය | අමාත්‍යාංශය / රාජ්‍ය අමාත්‍යාංශය |
|---|---|---|---|
| | කෘෂිකාර්මික නොවන නිෂ්පාදන වැඩිවීමේ ප්‍රතිශතය<br>IV. දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රයේ තරුණ කාන්තා හා පිරිමි ප්‍රතිශතය<br>V. අපනයන ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක තරුණ කාන්තා හා පිරිමි ප්‍රතිශතය<br>VI. ගෘහස්ථ නිෂ්පාදන තුළින් ග්‍රාමීය ප්‍රජාවන්හි පවුලේ ආදායම් වැඩි වූ ප්‍රතිශතය | පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපයීම.<br>**8.3.1** – ස්ත්‍රී පුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය<br>**2.3.2** – ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ආදායම | එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය<br>**3.** පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය<br>**4.** පශු සම්පත් ගොවිපොල ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය<br>**5.** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය<br>**6.** පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික නිෂ්පාදන හා අපනයන විවිධ රාජ්‍ය අමාත්‍යාංශය<br>**7.** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>**8.** සමූපාකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභොගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය<br>**9.** බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය<br>**10.** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය<br>**11.** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
